2018 ජූලි
01 කාණ්ඩය 08 කලාපය
ISSN 25792369
ආධාරය රු:50/-

# FORWARD®


## සටන් කරන තාරුණ්‍යයට




“එක රටක් මනු පවුරක්” වැඩසටහන යටතේ
පැවති ඉෆ්තාර් සමරුව
කොළඹ මාලිගාවත්ත ඉස්ලාමීය
මධ්‍යස්ථානයේදී...


02
අසාමාන්‍ය
නායකයෙක්...


03
අනාගතය
වෙනුවෙන්....


06
වසන්තම් දුරයි...


11
සමාජ පෙරළියකට
අවශ්‍ය මිනිසුන්...

# සාමාන්‍ය මිනිසෙක්... අසාමාන්‍ය නායකයෙක්...



ජීවිතයේ ප්‍රධාන තෝරාගැනීම් දෙකක් තිබේ. එකක්, පවතින තත්වය භාරගෙන ජීවත් වීමය. අනෙක, පවතින තත්වය වෙනස් කිරීමේ වගකීම භාරගැනීමය. එලෙස, ලෝකය වෙනස් කිරීමේ වගකීම භාරගත් බොහෝ වීරෝදාර මිනිස් පරපුරක් ලොවට දායාද කරන්නට රුසියන් විප්ලවයට හැකිවිය. ඉන් දේශපාලන, සමාජීය හා සංස්කෘතික වශයෙන් ලෝකයේ දිශානතිය වඩාත් සුභදායී ලෙස වෙනස් කරවීය. එවන් අසිරිමත් යුගයක මිනිස් සංහතියේ සංතුෂ්ටිය වෙනුවෙන් ධෛර්යසම්පන්නව දහඩිය කඳුළු හෙළූ මිනිසුන් තබාගිය බරැති පා සටහන් අතර ඇති යාකොව් ස්වෙර්ද්ලොව් ගේ පා සටහන් මඟින් ද ඔහුගේ වීරෝදාර කෙටි ජීවිතයේ අපේක්ෂාවන් පිළිබඳ අපට පැහැදිලි කරවයි.

1885 ජූනි 04 දින රුසියාවේ වොල්ගා පෙදෙසේ නිෂ්නොව්ගොරොද් හි (ගෝර්කි නගරය) උපත ලැබූ යාකොව් ස්වෙර්ද්ලොව් හය දෙනෙකුගෙන් යුත් පවුලේ තුන් වැනියායි. තම මව්පියන්ගේ වැඩකටයුතුවලට ද සහය වෙමින් පුංචි ස්වෙර්ද්ලොව් ප්‍රාථමික පාසලේදී වේගවත්ව හා දක්ෂ ලෙස ඉගෙන ගත්තේය. නමුත් ඔහු ද්විතීයික අධ්‍යාපනය ලබන අවධියේදී මේ ඉගෙන ගන්නා දේ, යල්පැන ගිය, සාම්ප්‍රදායික හා පවතින සමාජ ක්‍රමය පවත්වා ගැනීමට ආවඩන දේ බව ඉතා ඉක්මනින්ම වටහා ගත්තේය. ඒකාධිපති සාර් පාලනයේ කෲරත්වය පිළිබඳ ප්‍රශ්න කළ ඔහුට ඒවාට පිළිතුරු ලැබුණේ දඬුවම්වලින්ය.

මව මියයාමත් සමඟ පාසල් අධ්‍යාපනය හමාර කළ ස්වෙර්ද්ලොව් හට ඖෂධ කලවම් කරන්නෙකු ලෙස සේවයට බැඳීමට සිදුවිය. එහිදී ද ඔහු තම සගයින්ගේ දීර්ඝ සේවා මුර, වෙහෙසකර වැඩ, අඩු වැටුප් හා දුප්පත් ආහාර සලාකය පිළිබඳව තම හාම්පුතුන්ට පැමිණිලි කිරීමට තරම් එඩිතර විය. මේ නිසා ඔහු සේවයෙන් නෙරපා හැරීමට පවා ලක්විය. ඒ ඔහුට අවුරුදු 15ක් තරම් වයසේදීය.

ඉන්පසු තම ජීවිතය ගැටගසා ගන්නට නොයෙකුත් සුළු සුළු රැකියාවන්වල යෙදෙන්නට ඔහුට සිදුවිය. මේ කාලය, ඔහුගේ ජීවන මඟ වෙනස් කළේය. ඒ අතර අලුත් ලෝකයක දොරටු විවර කරමින් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී රහසිගත දේශපාලනය හා එක් වූ ස්වෙර්ද්ලොව් දක්ෂ සංවිධායකයෙකුගේ ලක්ෂණ පෙන්නුම් කරමින් කටයුතු කරන්නට විය.

සමස්ත රුසියාව පුරා පැතිර යන සාර් ආධිපත්‍යයට එරෙහි විරෝධය නිෂ්නිව්ගොරොද් වෙතද දැනෙන්ට විය. එහි පළමු කැළඹිල්ල ඇති වූයේ සාර් පාලනය විසින් මක්සිම් ගෝර්කිව නගරයෙන් නෙරපා හැරීමත් සමඟය. මෙයට විරුද්ධව විශාල පෙළපාලියක් හා උද්ඝෝෂණයක් සංවිධානය විය. ඉන් මසකට පසුව උද්ඝෝෂණයට නායකත්වය දුන් බොහෝ දෙනා අත්අඩංගුවට පත්විය. ඒ අතර ස්වෙර්ද්ලොව් ද විය. ඒ ඔහුගේ අත්අඩංගුවට පත්වීමේ පළමු අත්දැකීම විය.

1917 ඔක්තෝබර් 25 රාත්‍රියේ ප්‍රහාරක රතු හමුදා සාර්ගේ හිම මාළිගයට කඩා වැදුණහ. ලොව පළමු කම්කරු හා ගොවි ජනතාවගේ රාජ්‍යයත්, ජනතා කොමසාරිස් මණ්ඩලයත් තේරීපත් විය. සෝවියට් දේශය නිර්මාණය විය. 1917 නොවැම්බර් 08 වැනිදා ස්වෙර්ද්ලොව් මධ්‍ය විධායක සභාවේ සභාපතිවරයා බවය පත්විය.

විප්ලවයට පසුවත් ඊට පෙරත් ස්වෙර්ද්ලොව් සිය දේශපාලනමය කාර්යයන්ගේ තදින්ම ඇලී සිටියේය. ඔහු තම ජීවිත කාලයෙන් වසර 12ක්ම ගතකර තිබුණේ දේශපාලන සිරකරුවෙකු ලෙසයි. එනම් වසර පහමාරක් සිරකරුවෙක් ලෙසත් වසර හයක් සයිබීරියාවේ දුෂ්කර ප්‍රදේශවල පිටුවහලෙකු ලෙසත්ය.

ස්වෙර්ද්ලොව් සහමුලින්ම කැපවුණු දැඩි විමසිලිමත් හා නොසැලෙන ගුණයෙන් යුත් වෘත්තීය විප්ලවවාදියෙකු විය. ඔහුගේ මතකය ආශ්චර්යමත් විය. යමෙකුගේ ස්වභාවය විනිවිද දකින්නටත් කිසිවෙකුගේ හැකියාවේ පරිමාණය නිවැරදිව මැන හොඳින්ම කළ හැකි දේ ඔහුට පැවරීමටත් හැකි තරමේ අපූර්ව ප්‍රතිභාවක් ඔහු සතු විය.

විප්ලවයෙන් මාස 18කට පසු නොසිතූ මොහොතක ස්වෙර්ද්ලොව් වැන්නන්ගේ අත්දැකීම් හා කැපවීම් සෝවියට් භූමිය විසින් වඩ වඩාත් ඉල්ලා සිටින මොහොතක, 'ඉස්පන්කා' නම් උණ රෝගය වැළඳීමෙන් 1919 මාර්තු 16 වන දින ඔහු අපෙන් සදහටම සමු ගත්තේය. විශිෂ්ට සංවිධායකයෙකු ලෙසත් අතිශය ප්‍රායෝගික මිනිසෙකු ලෙසත් ඔහු සිය පක්ෂය හා සෝවියට් දේශය ගොඩනැංවීය. එමෙන්ම දක්ෂ ප්‍රචාරකයෙකු හා උද්ඝෝෂකයෙකු ලෙසත් ස්වෙර්ද්ලොව් බොහෝ මිනිසුන්ගේ මතකයේ නොමැකෙන සටහන් තබා ඇත. වසර 32ක් වැනි තම කෙටි ජීවිතය, ශක්තිමත් හා ජවසම්පන්න තරුණ විප්ලවවාදියෙකු ලෙස ගෙවා දැමූ ඔහු වරෙක මෙසේ පැවසීය. “ජීවිතය මැනිය හැක්කේ එය ගෙවා දමන කාලය මත නොව, අප ජීවිතයෙන් කුඩා කාලයක් වුවද ගෙවා දමන තීව්‍රතාවය මතය”. ස්වෙර්ද්ලොව් එය සිය භාවිතාවෙන්ම ඔප්පු කළේය.

## අනුර දිසානායක සහෝදරයා ග්‍රීසියේ සංචාරයක



එතෙර අපි සංවිධානයේ ග්‍රීසියේ ශාඛාව පිහිටුවීම ජවිපෙ නායක අනුර දිසානායක සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරුණි. ඒ පසුගිය ජූනි 24 දින ග්‍රීසියේ ඇතෑන්ස් නුවරදීය. මේ සඳහා එරට වෙසෙන විශාල පිරිසක් සහභාගී වූ අතර අනුර දිසානායක සහෝදරයා විසින් එම සමුළුවේ ප්‍රධාන දේශනය පවත්වන ලදී.

## අර්ථසාධක අරමුදලටත් බදු



සේවක අර්ථසාධක අරමුදලෙන් 2018 වර්ෂය සඳහා බදු ලෙස රුපියල් බිලියන 30ක් අය කර ඇති බවත් ආණ්ඩුව බදු අය කර නොගන්නා බවට කළ ප්‍රකාශ සම්පූර්ණ අසත්‍යයක් වී ඇති බවත් අන්තර් සමාගම් සේවක සංගමයේ සභාපති වසන්ත සමරසිංහ සහෝදරයා පැවසීය. ඒ පසුගිය ජූනි 25 දින පැවති මාධ්‍ය හමුවක් අතරතුරදීය. සේවක අර්ථසාධක අරමුදලෙන් බදු අය කර ගැනීම නීති විරෝධී බවත් එය බදු ප්‍රතිපත්තිය උල්ලංඝනය කිරීමක් බවත් මෙමඟින් ලක්ෂ 26ක් වන සේවකයින්ගේ සේවක ප්‍රතිලාභ 10.5% සිට 9% දක්වා අඩුවන බවත් වසන්ත සහෝදරයා විසින් වැඩිදුරටත් අවධාරණය කෙරුණි.

## විරු සිසු සැමරුම කොළඹදී



සමාජවාදී ශිෂ්‍ය සංගමය මඟින් සංවිධානය කරන ලද ජාතික ශිෂ්‍ය වීර දින සැමරුම පසුගිය ජූනි 20 වන දා කොළඹ, මහජන පුස්තකාල ශ්‍රවනාගාරයේ දී පැවැත්වුණි.

ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික කේ.ඩී. ලාල්කාන්ත සහෝදරයා, කැළණිය විශ්වවිද්‍යාලයේ ආචාර්ය අනුර කරුණාතිලක මහතා, සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාතික සංවිධායක රංගන දේවප්‍රිය සහෝදරයා, ශාන්ත බණ්ඩාර සහෝදරයාගේ සමකාලීනයෙකු සහ ශිෂ්‍ය ව්‍යාපාරයේ ඉදිරිපෙළ ක්‍රියාකාරිකයෙකු වූ ධර්මවර්ධන මුණසිංහ මහතා සහ එච්. බී. හේරත් සහෝදරයාගේ නැගණිය වන සීතා හේරත් මහත්මිය ඇතුළු පිරිසක් මෙම විරු සිසු සමරුව සඳහා සම්බන්ධ වූහ.

## ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් නේපාලයේ සංචාරයක



නේපාල එක්සත් මාක්ස් ලෙනින්වාදී කොමියුනිස්ට් පක්ෂයේ ආරාධනයෙන් ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා හා පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා නේපාලයේ සංචාරයක නිරත වූහ. මේ අතර කත්මණ්ඩු නුවර පැවති කාල් මාක්ස් සහෝදරයාගේ 200 වන ජන්ම දින සමරුවටද ඔවුන් සහභාගී විය. එම සැමරුම මැයි 30 හා 31 දෙදින පුරා පැවති අතර එම සමරු අවස්ථාවේ දී ටිල්වින් සිල්වා සහෝදරයා විසින් දේශීය ඉදිරිපත් කෙරුණි.

## ලාල්කාන්ත ජිනීවා ජාත්‍යන්තර කම්කරු සම්මේලනයට




ජාත්‍යන්තර කම්කරු සම්මේලනයේ වාර්ෂික සැසිවාරය මැයි 28 දින ස්විස්ටර්ලන්තයේ ජිනීවා නුවර දී පැවැත්වීය. ඒ සඳහා ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය නියෝජනය කරමින් ලාල්කාන්ත සහෝදරයා හා අන්තර් සමාගම් සේවක සංගමය නියෝජනය කරමින් නීතිඥ ජානක අධිකාරි සහෝදරයා ද සහභාගී වූ අතර එය පසුගිය ජූනි 8 වන දින පැවැත්විය.

## නකල්ස් රක්ෂිතයේ අක්කර 35ක් විකුණලා



නකල්ස් සංරක්ෂිත වනාන්තරයට අයත් ස්වාරක්ෂක කලාපයේ අක්කර 35ක භූමි භාගයක හෝටලයක් ඉදිකිරීම සඳහා සමාගමකට ලබා දී ඇති බව තහවුරු වී ඇතැයි ජනතා විමුක්ති පෙරමුණේ ඌව පළාත් සභා මන්ත්‍රී සමන්ත විද්‍යාරත්න සහෝදරයා පවසයි. ඔහු සහ පරිසර සංවිධාන නියෝජිතයින් විසින් එම ප්‍රදේශයේ පසුගිය 15 වන දා සංචාරයක නිරත විය. එහිදී ඔවුන් අනාවරණය කළේ නකල්ස් රක්ෂිතයේ ඉඩම් ලබා නොදුන් බවට ලක්ෂ්මන් කිරිඇල්ල අමාත්‍යවරයා විසින් පසුගිය දා කළ ප්‍රකාශයන් සම්පූර්ණ අසත්‍යයක් බවයි.

# අනාගතය වෙනුවෙන් දුම්බර වනපෙත **සුරකිමු!**



අවුරුද්ද පුරාම මීදුමින් වැසීගත් නිසා "දුම්බර" කඳු පද්ධතිය නමින් හඳුන්වන එය නකල්ස් කඳුවැටිය, ගොම්බානිය කඳුවැටිය, කෙහෙල්පත් දොරුව, කොබෝනිගල, කැටපහණ, වාමපුරගල, ලකේගල, ලබුලැස් පතන, දුම්බාන ගල හා ගල්කුල වැනි කඳු ශිඛර ගණනාවකින් සමන්විත, මධ්‍ය කඳුකරයට අයත් අධිසංවේදී පරිසර පද්ධතියකි. 1873 බ්‍රිතාන්‍ය පාලන සමයේ දී මීටර් 1,500ට ඉහළ ප්‍රදේශ රක්ෂිත ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීමම, මෙහි පාරිසරික වැදගත්කමේ අතීතය පෙන්නුම් කරයි. 2000 වසරේදී මෙහි අක්කර 17,500ක් සංරක්ෂිත වනාන්තර බවට පත් කෙරිණි. එමෙන්ම මුළු කඳුවැටියම ජෛවගෝල රක්ෂිතයක් වශයෙන් ද නම් කර තිබේ. එය යුනෙස්කෝ ලෝක උරුමයක් ලෙස 2010 දී නම් කිරීම තුළින්ම දුම්බර කඳුවැටිය ලෝකයේ පාරිසරික සමතුලිතතාවයට කෙතරම් නම් වැදගත් වීද යන්න අපට තේරුම්ගත හැක.

රිවර්ස්ටන්, මී මුරේ, සේරැල්ල, වැද්දා පැණි ඇල්ල, දූලි ඇල්ල සහ බඹරකිරි ඇල්ල වැනි ස්ථානවල ඇති සුන්දරත්වය දිනක දී එහි ඇදෙන සංචාරකයින් ගණනින්ම නිගමනය කළ හැක. ඊසානදිග සහ නිරිතදිග මෝසම් දෙකෙන්ම තමන් වෙත ජලය ඇදගන්නා දුම්බර කඳුවැටිය මහවැලි නිම්නයත්, මාතලේ නිම්නයත් පෝෂණය කරමින් වර්ෂය පුරාම ජලය බෙදාහරින ''ස්පොන්ජ්'' එකෙක් ලෙස ක්‍රියාත්මක වේ.


දැනට වාර්තා වන අන්දමට කුල 141කට අයත් සපුෂ්පක ශාක විශේෂ 1033ක් දුම්බරින් හමු වේ. ඉන් විශේෂ 160 ක්ම අප රටටම ආවේණික ඒවා වේ. මෙහි වාර්තා වන පෘෂ්ඨවංශී සත්ව විශේෂ ප්‍රමාණය 247 කි.

මේ වටිනා බිම අනාගතය උදෙසා සුරක්ෂිත කළ යුතු අධිසංවේදී පරිසර පද්ධතියක් හා ලෝක උරුමයකි. එහි ස්වාරක්ෂක කලාපයේ (ප්‍රේරණ) සංරක්ෂිත ප්‍රදේශවලින් අක්කර 21,000ක් පෞද්ගලික සමාගම්වලට විකිණීමට කටයුතු කර තිබීමට එරෙහිව පරිසරයට ආදරය කරන බොහෝ දෙනාගේ විරෝධය ඇවිළී තිබේ.

නකල්ස් අධිරක්ෂිත ප්‍රදේශය මෙහි පළමු ගොදුර වී තිබෙන අතර එය පැවරීම අක්කරයක් රුපියල් 2850ක වාර්ෂික බදු පදනමක් යටතේ සිදුකර ඇත. හෝටල්, ගල්කොරි, සත්ව පාලනය සඳහා මෙම ඉඩම් විකුණා තිබේ. රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය එක්ව සිදුකරන මේ සංහාරක වැඩසටහන පරාජයට පත් නොකළහොත් ඉතාමත් කෙටි කාලයක් තුළ මේ යුනෙස්කෝ ලෝක උරුමය අනාගත පරපුරට අහිමි වී යනු නොඅනුමානය.

**එය යුනෙස්කෝ ලෝක උරුමයක් ලෙස 2010 දී නම් කිරීම තුළින්ම දුම්බර කඳුවැටිය ලෝකයේ පාරිසරික සමතුලිතතාවයට කෙතරම් නම් වැදගත් වීද යන්න අපට තේරුම්ගත හැක.**

# සොක්කන් ලොක්කන් කළ විධායකය සහ ලොක්කන් සොක්කන් වන 20



**දැන් ධනපති නායකයින්ගේ දෙපරැන්දේ සිටි ඊනියා වම්මුන්ද ජනතා විමුක්ති පෙරමුණට මාක්ස්වාදය කියාදීමට සැරසෙන්නේ, බල්ලා මැරෙන විට යන එන මං නැතිවන මැක්කන්ට සේ ධනපති නායකයින්ගේ බලය මොටවීම ඔවුන්ටද දරා ගැනීමට නොහැකි නිසාය.**

"විධායක ජනාධිපති? අපෝ ඒක ගැනනම් කතා කරන්න එපා. ඔය මඟුල අහලයි, ඔය මඟුලෙ කෙරුවාවයි දෙකම එපා වෙලා. ආපු හැම ලොක්කෙක්ම ටෝක් කරේ නම් අයින් වෙලා පයින් යන්න. හැබැයි, හැම එකාම ගියේ ඔක්කොම පොඩිපට්ටම් කරගෙන පාර මැද්දෙන්මයි."

මේ පාර වෙන මොකක්වත් නෙවෙයි. 1978 දී ජේ.ආර්. ජයවර්ධන විසින් හඳුන්වා දුන් ගැහැණියක් පිරිමියෙක් හා පිරිමියෙක් ගැහැණියක් බවට පත්කිරීමම පමණක් කළ නොහැකි, අනිත් සියල්ලම කළ හැකි අසීමිත බලතල සහිත විධායක ජනාධිපති මාවතයි. අසීමිත බලතල සහිත විධායකය ගැන මේ දවස්වල විවිධ කතා ඇසීම ජනතාවගේ පැත්තෙන් නම් සුභදායකය එහෙත් ධනපති පාලකයන්ගේ හැසිරීම හාස්‍යජනකය. ඒ වෙන කිසිවක් නිසා නොව සෑම ධනපති පාලකයෙක්ම විධායක ජනාධිපතිධුරය අහෝසි කිරීමේ මාතෘකාව තම දේශපාලන ජයග්‍රහණ වෙනුවෙන් බිල්ලට දුන් බව අමතක කරමින් දැන් විවිධ මනෝවිකාර දෙඩීම නිසායි.

ඉතිහාසයේ ඇඳගෙන නැටූ සළුපිළි උනා වර්තමානයේ දී නිරුවතින් නැටීම, ධනපති නායකයින්ගේ හා ඔවුන් වෙනුවෙන් වන්දිභට්ටකම් කරන සහචරයින්ගේ නිසඟ ලක්ෂණයකි. එය හෙටද වීම අරුමයක් නැත. 1994 දී පළමු වරට විධායක ජනාධිපතිධුරය අහෝසි කරන ඊනියා පොරොන්දුව ලබා දෙන්නේ චන්ද්‍රිකා කුමාරතුංගය. ඒ එම මැතිවරණයේදී ජනතා විමුක්ති පෙරමුණෙන් ඉදිරිපත් කළ නිහාල් ගලප්පත්ති සහෝදරයා මැතිවරණ සටනින් ඉවත් වන පොරොන්දුව මතය. ඉන්පසු 2001 පරිවාස ආණ්ඩුව හදන මොහොතේදීත්, 2004 ජනතා විමුක්ති පෙරමුණ හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අතර සන්ධානය ගොඩනගන මොහොතේදීත් තිබූ ප්‍රධාන එකඟතාවය වූයේ විධායක ජනාධිපතිධුරය අහෝසි කිරීමයි. නමුත් ඔවුන් තම පොරොන්දු සියල්ල විසිකර දැමුවේ ඉහත කී නිසඟ ධනපති දේශපාලන ලක්ෂණ පෙන්වමිනි.

ඉන්පසුව 2005 දී මහින්ද රාජපක්ෂ ද ඉහත කී නායකයින්ගේ පාරේම ගමන් කළේ කිසිඳු හිරිකිතයකින් තොරවය. ඔහුගේ ජනාධිපතිවරන වේදිකාවේ ප්‍රධාන සටන් පාඨ අතර මෙම ඊනියා පොරොන්දුව තිබූ බව ඔහුට නම් අමතකය.

කෙසේවුවද 2015 ජනාධිපතිවරණයේදී ජනවරම දිනාගැනීමට මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාට හැකි වූයේ ප්‍රජාතන්ත්‍රවාදය පුළුල් කිරීම වෙනුවෙන් පෙළගැසුණු පුළුල් බලවේගයන් නිසාය. එහි ද ප්‍රධානතම පොරොන්දුව වූයේ විධායක ජනාධිපතිධුරය අහෝසි කිරීමයි. නමුත් සිරිසේන ද දැන් පැරණි ධනපති නායකයින්ගේම පාරේම ගමන් කරමින් සිටින්නේ කිසිඳු විළිසංගයකින් තොරව, ප්‍රසිද්ධ වේදිකාවේදීම 2015 තමන්ට ලැබුණු ජනවරමට හා ඒ වෙනුවෙන් ඇපකැප වූ ජනතාවට සිය පශ්චාත්තාපය පෙන්වමින්ය.

ඒ විධායකයේ ඉතිහාසයයි. රැවටීමේ ඉතිහාසයයි. දේශපාලන වාසි වෙනුවෙන් ජනතාව ගොනාට ඇන්දවූ ඉතිහාසයයි. අද ඒ ඉතිහාසය අමතක කර දමමින් කුලප්පු වී සිටින්නේ අසීමිත බලතල සහිතව ලොක්කන් වූ ධනපති සොක්කන්ය. ඒ තමන් නැවතත් සොක්කන් වීමට යන වග ඉවෙන් මෙන් දැනීම නිසා විය යුතුය. මේ ඉව වැටෙන්නේ ජනතා විමුක්ති පෙරමුණ විසින් 20 වන ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒමට යෝජනා කිරීමත් සමඟය. ඉදින් ධනපති නායකයින් හා ඔවුන්ගේ පා මිරිකන්නන් දැන් පිස්සු බල්ලන් සේ දඟලන්නේ ඒ නිසාය. කොහොම නමුත් දැන් 20 පාර්ලිමේන්තුවට ගෙනවිත් අවසන්ය. එහිහි අන්තර්ගත වන්නේ වෙන කිසිවක් නොවේ. අසීමිත බලතල සහිත අත්තනෝමතික විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම වෙනුවෙන් ගෙනෙන ලද යෝජනාවයි.

ඉදින් ධනපති නායකයින් කලබලවීම සාධාරණය. ඔවුන් දැන් පුස් තර්ක ඉදිරිපත් කරමින් 20 වන සංශෝධනයට එරෙහිව අවි අමෝරාගෙන සිටී. විධායක ජනාධිපතිධුරයේ වැදගත්කම ගැන මනස්ගාත මවාපාමින් සිටී. රටේ ඒකීයභාවය ගැන කටමැත දොඩවයි. යුද්ධයක් හෝ රට බෙදෙන ක්‍රියාමාර්ගයක් හෝ පෙනෙන තෙක් මානයකවත් නොමැති වටපිටාවක් තුළ 20 ගෙනාවොත් රට බෙදෙන බවට නයි අරියි. යුද්ධය පැවති 1994, 2001, 2004 හා 2008 වසරවලදී පවා පැවැත්වූ ජනාධිපතිවරණ වේදිකාවලදී විධායකය අහෝසි කරන බවට කෑමොර දුන් ධනපති නායකයින් හා ඔවුන්ගේ සහචර නඩය දැන් විධායකය නොමැතිනම් රට බෙදීමක් ගැන කතා කිරීම විහිළුවකි. එමෙන්ම ආණ්ඩුකාරවරයාගේ බලතල අඩුවීමක් ද මෙමඟින් කිසිසේත්ම සිදු නොවේ.

එසේම දැන් ධනපති නායකයින්ගේ දෙපරැන්දේ සිටි ඊනියා වම්මුන්ද ජනතා විමුක්ති පෙරමුණට මාක්ස්වාදය කියාදීමට සැරසෙන්නේ, බල්ලා මැරෙන විට යන එන මං නැතිවන මැක්කන්ට සේ ධනපති නායකයින්ගේ බලය මොටවීම ඔවුන්ටද දරා ගැනීමට නොහැකි නිසාය. අපිට ඔවුන්ගේ පාඩම් අදාළම නැත. අපි පංති අරගලයද හොඳින් හඳුනන්නෙමු. ප්‍රතිසංස්කරණද අපි හොඳින්ම හඳුනන්නෙමු. එසේම අපි ප්‍රතිසංස්කරණ වෙනුවෙන් සටන් කිරීමටද බිය නොවන්නෙමු. ඒවා දිනා ගැනීමට නායකත්වය ද දෙන්නෙමු. නමුත් එය අපේ සමාජවාදී සමාජ විප්ලවයේ මාවත නොවන බව අපි හොඳින්ම දන්නෙමු. හුදෙක්ම ප්‍රතිසංස්කරණ අප පංති අරගලයේ උපකරණයක් ලෙස පමණක් භාවිතා කරන බවද පවසන්නට කැමැත්තෙමු.

ධනපති පාලනය දුර්වල වූ ඉතිහාසයේ සෑම මොහොතකදීම ජනතා විමුක්ති පෙරමුණ විසින් ජනතාවට ප්‍රජාතන්ත්‍රවාදයේ දොරගුළු ඇර දීමට මැදිහත් විය. අද ද ධනපති පාලකයින් දුර්වලය. 2015 දී මෛත්‍රීපාල ජනාධිපතිවරයා දුන් පොරොන්දුද දැන් පුස්සක් බවට පත්වී ඇත. එම නිසා 20 වන සංශෝධනය ඉතාම කාලෝචිතය. මේ අවස්ථාව ප්‍රයෝජනයට ගනිමින් ප්‍රජාතන්ත්‍රවාදයේ අවකාශය පුළුල් කර ගැනීමට සියලු බලවේග පෙළගැස්විය යුතුය. ඒ වෙනුවෙන්, රටේ පොදු ජනතාවට මෙන්ම තරුණ තරුණියන්ට ද පැවරී ඇත්තේ විශාල වගකීමකි. 20 ජයග්‍රහණය කරවීම වෙනුවෙන් කළහැකි හා කළ යුතු කාර්යයන්ද බොහෝය. එසේම තවදුරටත් විධායක ජනාධිපතිධුරය අහෝසි කිරීම මැතිවරණ වේදිකාවලදී ජනතාව රවටන පොරොන්දුවක් බවට පත්වීමට අප කිසිසේත්ම ඉඩ නොතැබිය යුතුය. මෙය ජයග්‍රහණයෙන් කෙළවර කළ යුතුය. නැතහොත් ඊනියා ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ සළුපිළි උනා දමා නිරුවත් කළ යුතුය.

FORWARD
සමාජවාදී තරුණ සංගමයේ මධ්‍යම පුවත්පත

464/20, පන්නිපිටිය පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
Tel: 0112193721
Email: syuforwardnews@gmail.com
syulanka@gmail.com
fb:syulanka
web:syulanka.com

# හෙට වෙනුවෙන් අද ගත යුතු තීන්දුව

අද අපි ජීවත් වෙන වටපිටාව කියන්නේ විද්‍යාවේ දියුණුවෙන් ගොඩක් තාක්ෂණික උපකරණ නිපදවලා, ඒවා පරිහරණය කරමින් අපේ ජීවිත පහසුවෙන් ගතකරන්න පුළුවන් වටපිටාවක්. නමුත් ඇත්තටම හිතලා බැලුවොත්, ඒක එහෙමද? ඇත්තෙන්ම එහෙම නෑ නේද? ඒ වෙනුවට අපිට ඉතා අමාරුවෙන් "කට්ට කාගෙන" "හති හලාගෙන" තමයි ජීවත් වෙන්න වෙලා තියෙන්නෙ. අපිට අපේ අයිතීන් භුක්ති විඳිමින් නිදහසේ ජීවත් වෙන්න පුළුවන් කියලා රටේ පාලකයෝ හැම වෙලාවෙම කියනවා ඇහිලා ඇති. ඒත් අපිට නිදහසේ කරන්න පුළුවන් එකම දේ බඩගින්නේ මැරෙන එක විතරයි.

අපි මේ කියන කතාව පහුගිය කාලෙ සිදුවෙච්ච දේවලින්ම අපිට පෙන්නලා දෙන්න පුළුවන්. ඒ තමයි තමන්ගෙ අයිතිය වෙනුවෙන් සටන් කරපු ශිෂ්‍යයො, කම්කරුවො, ධීවරයො, ගොවියො වගේම පානීය ජලය ඉල්ලා පාරට බැහැපු රතුපස්වල ජනතාවටත් එවකට තිබුණු ආණ්ඩුව තුවක්කුවෙන් උත්තර දීපු විදිය. ඒ නිසා තමයි ඕනෑම කෙනෙකුට තමන් ජීවත් වෙලා ඉන්න රටේ පවතින දේශපාලනය වැදගත් වෙන්නෙ. විශේෂයෙන් තරුණයින් කියන්නෙ රටක අනාගතය, තමන්ගෙ අයිතිවාසිකම් වෙනුවෙන් ඉස්සර වෙලාම ඉදිරිපත් වෙන පිරිස. අන්න ඒ නිසාමයි අපේ රටේ අනාගත දේශපාලනය තරුණ අපිට වැදගත් වෙන්නෙ.

අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඒ කිව්වෙ, අපි හැමෝටම බලපාන මූලික නීතිය 20 වෙනි වතාවටත් සංශෝධනය කරන්න යනවා කියලා ඔබ කවුරුත් දන්නවා ඇති. ඒත් තරුණ බොහෝ දෙනෙක්ට මේක අපිට වැඩක් ඇති දෙයක් කියලා හිතෙන්නේ නැතුව ඇති. ඒ කොහොම වුනත් රටකට ප්‍රජාතන්ත්‍රවාදය වගේ එකක් වැදගත් වෙන්නෙ කොහොමද කියලා කියනවා නම් අන්න ඒකට දෙන්න තියෙන හොඳම උත්තරේත්, අපි අර ඉහතින් කියපු උදාහරණයම තමයි.

යම් රටක අරගල, ඉල්ලීම්වලට දෙන උත්තරේ තීරණය කරන්නේ ඒ රටේ පවතින ප්‍රජාතන්ත්‍රවාදයේ මට්ටම අනුවයි කියලා කියන්න පුළුවන්. අන්න ඒ ප්‍රජාතන්ත්‍රවාදය තවදුරටත් අපේ රටේ තහවුරු කරන්න ගන්න උත්සාහයක් තමයි ඉහත කියපු 20 වන ව්‍යවස්ථා සංශෝධනය. ඒ කියන්නේ අපට බලපාන මූලික නීතිය එක් අයෙකුට පමණක් හසුරුවන්න තියෙන බලය (විධායක ජනාධිපති බලතල) ඉවත් කරලා, ඒ බලය කණ්ඩායමක් අතට එහෙමත් නැත්නම් කණ්ඩායමක බහුතර තීරණයට යටත් කරන එක (පාර්ලිමේන්තුවට පවරන එක)යි. අන්න ඒ නිසයි තමන්ගේ රටේ තමන්ට අවශ්‍ය ලෙස ජීවත් වෙන්න ඕනා කියලා හිතන කාට වුනත් 20 වන සංශෝධනය වැදගත් වෙන්නේ. මේ නව වෙනස තියෙන ක්‍රමයට වඩා සාධාරණයි, ප්‍රජාතන්ත්‍රවාදීයි. අන්න ඒ නිසා මේ මොහොතේදී ඉදිරිපත් කර ඇති 20 වන ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කිරීමට තරුණ අප අපේ රටේ පාලකයන්ට බල කර සිටිය යුතුයි.


**ජූනි 18**



දිවියෙකු ඔසවා ගත් තරුණ පිරිසක් සහිත ඡායාරූප පෙළක් FB පිටු අතර වේගයෙන් සැරිසරමින් තිබෙනු කාගේත් අවධානයට ලක් වුණා. කිලිනොච්චි ප්‍රදේශයේදී ගම්වැදුණු දිවියෙක් මිනිසුන් කීපදෙනෙකුව සපාකෑමත් සමඟ ඊට නිසි පිළියම් යෙදීමට බලධාරීන් අසමත් වීම හේතු කොටගෙන ඇති වූ මෙම සිදුවීමෙන් බොහෝදෙනෙකු පීඩාවට ලක් විය. ජනතාව මෙවන් සිදුවීමක දී කලබලයට පත්වීම සාමාන්‍ය දෙයක් වුවද මොනයම්ම වූ සතෙකුට වුව එලෙස වටකර පොලු මුගුරුවලින් පහර දී මරා දැමීම, ශිෂ්ට සම්පන්න සමාජයක මිනිසුන් ලෙස අපට කිසිසේත්ම අනුමත කළ නොහැක. මන්ද "මිනිසුන්" යනු මනසින් උසස්, සතුන්ගේ හැසිරීම් රටාවන්ට එහා ගිය උසස් සමාජීය ගතිගුණ සහිත ජීවින් පිරිසක් වන නිසාවෙනි.

පවතින ක්‍රමය මිනිසුන්ගේ ප්‍රශ්න විසඳීමට අසමත් යල්පැන ගිය එකක්ය යන්න මෙකී සිදුවීම හරහා ද මොනවට කියා පෑවේය. ඒ දිවියෙකු වැනි සතෙකු පවා නිර්වින්දනය කර අල්ලා ගැනීමට නොහැකි නිලධාරීන් පිරිසක් වනජීවී දෙපාර්තමේන්තුව තුළ සේවයේ යෙදවී ඇත්නම් ඒ පිළිබඳව වගකිව යුතුව ඇත්තේ පවතින රාජ්‍ය යාන්ත්‍රණයේ දුර්වලතාවය හැරෙන්ට වෙන යමක් නොවේ.

**ජූනි 20**



ජාතික ශිෂ්‍ය වීර දිනය වෙනුවෙන් දින කිහිපයක පටන් FB පිටු පුරාවට නිර්මාණය වූ පෝස්ට් දැකගත හැකි විය. ලාංකීය ඉතිහාසයේ නිදහස් අධ්‍යාපන අයිතිය මෙරට ශිෂ්‍ය ප්‍රජාවට හිමි වීමෙන් පසුව ඉන් වසර කිහිපයක් ඉක්ම යත්ම ධනපති පාලකයන් විසින් එම නිදහස් අධ්‍යාපන අයිතිය ඔවුන්ගෙන් උදුරා ගැනීමට නැවතත් කටයුතු කළේය. ඊට එරෙහිව ලාංකීය ශිෂ්‍ය ප්‍රජාව අඛණ්ඩ අරගලයක් දියත් කළ අතර බලයට පත් සෑම ධනපති ආණ්ඩුවක්ම පාහේ ශිෂ්‍ය අයිතිවාසිකම් කප්පාදුවට ලක් කළේය.

ඊට එරෙහිව තම අනාගත පරපුරේ නිදහස් අධ්‍යාපන අයිතිය වෙනුවෙන් ලාංකීය ශිෂ්‍ය ප්‍රජාව විසින් ගෙනගිය අරගලයේ දී සියදහස් ගණනින් ජීවිත පිදීමටත් සිරගත වී වධ බන්ධනයන්ට ලක්වීමටත් ඔවුන්ට සිදුවිය. එහිදී වැගිරුණු ලේ, දහඩිය හා කඳුළු ප්‍රමාණය අපමණය. එවන් සිසු විරුවන් සිහිගැන්වීම වෙනුවෙන් ජූනි 20 ජාතික ශිෂ්‍ය වීර දිනය ලෙස ලාංකීය ශිෂ්‍ය ප්‍රජාව විසින් සලකනු ලැබේ. ඒ වෙනුවෙන් සමාජවාදී ශිෂ්‍ය සංගමය මඟින් මෙවරද කොළඹ, මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේදී සැමරුම් වැඩසටහනක් සංවිධානය කොට තිබිණි.

**ජූනි 22**

### ඥානසාර හිමි හිරෙන් නිදහස්



පසුගිය දා ඥානසාර භික්ෂුව සිරගත කිරීම සම්බන්ධව මහත් වූ ඝෝෂාවක් FB පිටු අතර දක්නට හැකිවිය. අප රටේදී නීතිය නිසි ලෙස ක්‍රියාවේ නොයෙදීම සම්බන්ධව විවිධ ආකාරයේ චෝදනා ගණනාවක් වත්මන් ආණ්ඩුවට එල්ල වෙමින් පවතී. එහෙත් එවන් වටපිටාවක වුව මෙම සිදුවීම සම්බන්ධයෙන් ද මහත් වූ විවේචනයන් රට පුරා පැතිර යන්නට විය. නමුදු මෙහිදී සංවාදයට නොගැනුණ එහෙත් සංවාදයට ගතයුතුව තිබුණු කරුණක් වූයේ ඥානසාර භික්ෂුව සිරගත කෙරුණේ කුමන කරුණකටද යන්නයි.

අප ජීවත් වන සමාජයේ තුළ තම ස්වාමිපුරුෂයා සහ පියා අහිමිව අසරණ වූ කාන්තාවකට, පවතින නීතියටද ප්‍රජාතන්ත්‍රවාදයටද අනුව පිළිසරණක් පැතිය හැකි එකම ස්ථානය වන්නේ අධිකරණයයි. එවන් ස්ථානයකදී භික්ෂුවගේ එම හැසීරීම කාට වුව අනුමත කළ හැකිද? මෙරට අධිකරණ පද්ධතිය පිළිබඳව අපට පොදු විවේචනයක් පැවතිද අධිකරණ භූමිය තුළ ඕනෑම අයෙකු විසින් හැසිරිය යුතු ආකාරයක් පවතින අතර ඊට එරෙහි වන විටකදී පවතින නීතිය අනුව කටයුතු කිරීම රටේ පොදු නීතියයි. එබැවින් තරාතිරම නොබලා නීතිය කාටත් සමව ක්‍රියාවේ යෙදවිය යුතුය යන්න අවිවාදිතය.

එබැවින් මෙවන් සිදුවීම් දෙස වඩාත් සිහිණුවනින් බලා සිවුරු පොරවා ගත් පමණින් සෑම කෙනෙක්ම භික්ෂුවක් වන්නේ දැයි සැකහැර දැනගැනීමේ වගකීම සියල්ලන්ගේම වගකීමයි.

**ජූනි 24**

### කොල්ලකරුවෙකු පොලිස් වෙඩිපහරින් මරුට

ඉකුත් 19 වනදා මාතර ප්‍රදේශයේදී ස්වර්ණාභරණ වෙළඳසැලක් කොල්ලකෑමට පැමිණි කොල්ලකරුවන් හා පොලීසිය අතර ගැටුමක් සිදුවූ අතර මේ පිළිබදව වන CCTV දර්ශනයන් FB පිටු පුරාම දක්නට හැකි විය. එකී සිදුවීමෙන් පසු අත්අඩංගුවට පත් සැකකරුවන් අතරින් එක් අයෙකු සඟවා ඇති " ආයුධ පෙන්වීමට ගොස් අත් බෝම්බ ප්‍රහාරයක් පොලීසිය වෙත එල්ල කිරීමට යාමේදී" පොලිස් වෙඩිපහරින් මිය ගිය බවට පුවත් පළවිය.

කලක පටන්ම අත්අඩංගුවේදී මිය යන සැකකරුවන් සම්බන්ධව අසන්නට ලැබෙන්නේ මෙවැනි පුවත්ය. පොලීසිය පාර්ශවයෙන් ඉදිරිපත් කරනු මෙම චෝදනාව දැන්නම් ඕනෑම කුඩා දරුවකුට වුව කටපාඩමින් කිව හැකිය. කිසියම් හෝ චෝදනාවකට ලක්වන අයෙක් අධිකරණයක් හමුවේ වැරදිකරුවකු වන තෙක් ඔහු හෝ ඇය සැකකරුවෙකු පමණි. ඒ අනුව අධිකරණයේදී වරදකරුවෙකු වන තුරු ඔහුට දඬුවම් කිරීම ප්‍රජාතන්ත්‍රවාදයට අනුව සිදුකළ නොහැක්කකි. පෙර පැවති රාජපක්ෂ ආණ්ඩුව සමයේ මෙන්ම වර්තමාන යහපාලන ආණ්ඩුව තුළද සිදුකරමින් තිබෙන මෙකී ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියා හෙටද ඕනෑම කෙනෙකු හමුවේ වුව සිදුවිය හැකි බව බුකිවාසී සැම තම සිතට ගත යුතුමය.

# "වසන්තම්" දුරයි අපි කාටත් මිතුරේ...



වානරයාගේ සිට මිනිසා දක්වා පරිණාමය වීමේ ඉතා දිගු ඉතිහාසය තුළ මිනිස් සමාජය විසින් අත්හැර දැ සහ අත්පත් කොටගත් දෑ බෙහෝය. එහෙත් සැබවින්ම අප අත්හැරිය යුතු සියල්ල අත්හැර, අත්පත් කොටගත යුතු සියල්ල අත්පත් කොටගෙන ඇත්දැයි සැක සිතේ. ඉතා නොදියුණු, අශිෂ්ට හා වනචාරී ඇවතුම් පැවතුම් පිරි මිනිස් ඉතිහාසයේ මුල්ම තත්පර කිහිපයේ දී පමණක් නොව, අතිශය දියුණු, ශිෂ්ට සම්පන්න නූතන මිනිසා විසින් ගෙවූ අවසන් තත්පරය තුළත් අප අත්විඳි අම්හිරි සත්‍යයක් ඇත. මනසින් උසස් වූ නිසා "මිනිසුන්" වූ අපි තවමත් උනුන් කාකොටා ගනිමින් ඇත්තෙමු. විටෙක ආගම් අනුව ද විටෙක ජාතිකත්වයන් අනුව ද තවත් විටෙක කුලගොත් අනුව ද බෙදී අපි එකිනෙකා මරාගනිමින් සිටින්නෙමු. එහෙත් අප අතර ඇති සැබෑ විද්‍යාත්මක බෙදීම වනුයේ ප්‍රධාන මානව වර්ග ත්‍රිත්වයක් පමණි. ඒ හැරුණු විට අප අද හිස පළඳන් ඉන්නා සිංහලකම් හෝ දෙමළකම් හෝ මුස්ලිම්කම් හෝ යනු එම ප්‍රධාන මානව කාණ්ඩ තුනෙහි සම්මිශ්‍රණයෙන් ගොඩනැගි අනුකාණ්ඩ පමණි. ඉඳින් වරෙක සුනිල් ආරියරත්නයන් ලියූ පරිදි මිනිසා කුමන මානව වර්ගයකට අයත් වුවද, කුමන ජාතිකත්වයකට අයත් වුවද, කුමන ආගමකට අයත් වුවද අප කාගේත් සිරුරු පුරා දුවන්නේ එකම රතු ලෙයකි.

***"මොංගෝලියානුවනේ - කහවන් ආසියාවේ***
***කොකේසියානුවනේ - සුදුවන් යුරෝ දේසේ***
***නීග්‍රෝවරුනේ - කළුවන් අප්‍රිකාවේ***
***උරය පලා සැතකින් - බලන් රුහිරු***
***එක රතු පැහැයෙන් ගලා හැලෙන***
***අයුරු....."***

ඉඳින් මේ කිසිඳු බෙදීමක් ගැන අල්පෙනිත්තක තරම්වත් දැනීමක් නොමැති සුපිරිසිදු කිරිදරුවන් ගැන රත්න ශ්‍රී විජේසිංහයන් ලියුයේ මෙසේය.

***"........ නැහැය, කට, අත, පය***
***යන්තමට සලකුණු කර***
***අලුත් මැටි ගුලි ගෙන***
***මේ දැන් ඇඹූ රූ මෙන්***
***ජාති, කුල, ගොත්, නම් ගම්***
***ලේබල් රහිත බිළිඳුන්........"*** ඉඳින් බිළිඳෙක් උපන් දා පටන්ම කාවද්දන්නේ ලේබල්ගත ජාතිවාදය නොවේද? එසේ ජාතිවාදයේ අක්මුල් විහිද ගොස් මනුෂ්‍යත්වය වෙනුවට තිරිසන් බව දළුලා වැඩෙන ලෝකය තුළ ජාතිවාදයේ සතුරු බවින් පිල් බෙදී මිනිසුන් මුලා වී ඇති බව ජිප්සීස් නායක සුනිල් පෙරේරා ද ගැයුවා මතකය.

***"....මනුස්සකම් අහක දමා - ජාතිවාදයෙන් උදම් අනා***
***සතුරුකමින් පිල් බෙදිලා - මිනිසා මුලා වෙලා......."***

එලෙස මුලා වූ ලෝකය තුළ මිනිස් හැඟීම් පවා ඉතා අසරණව පිහිටක් පතනු අප ඕනෑ තරම් දැක ඇත්තෙමු. එහි දරුණුතම වින්දිතයා වන්නේ යෞවන ප්‍රේමයයි. ඒ ගැන සුනිල් ආරියරත්නයන් ලියුවේ මෙසේය.

***"මීන නුවන් යුගින් බලන් මීනා මීනා***
***තල් අරඹේ තල් පවුරෙන් එබී බලන් මීනා***
***බලන්න බෑ බණ්ඩාරේ***
***උඩරට කුල නිලබල යුතු බණ්ඩාරේ***
***බණ්ඩාරේ...."***

මෙලෙස උතුරේ, දකුණේ මෙන්ම නැගෙනහිරින් ද උදා වීමට තතනන යොවුන් ප්‍රේමයට පවා වැටකඩොළු බැඳෙන්නේත් මේ හිත්පිත් නොමැති ජාතිවාදයේ නපුර විසිනි. රාමලාන් සඳ බැලීමට ෆාතිමාට ආදර ඇරයුමක් කරනු ලබන මහින්ද චන්ද්‍රසේකරයන් මේ සමාජ ඛේදවාචකය විනිවිදීමට උත්සාහ දරා ඇත්තේ අතිශය සෞන්දර්යාත්මක වියමනක් ලෙසිනි.

***"මරතෝඩිය රටා ඇඳේ අතේ කැකුළු පිපිලා***
***මොට්ටැක්කිලි තිරෙන් වැසී රටා වැළපෙතේ***
***මුකුතෝඩි තිරුවංගල් එළියට අත වනනා***
***රාමලාන් සඳ බලන්න එන්න ෆාතිමා......"***

නමුදු සැබවින්ම මේ මහා බාධා පවුරු බිඳ හෙළමින් ආදරය ජීවත් කරවූ ප්‍රේමකථා ද අප අතර නැතුවාම නොවේ. සිංහල සිංදු කියන නළලේ තිලක තියන කිරිල්ලක් ගැන ආදරණීය රත්න ශ්‍රී ශූරීන් විසින් ගී ලියුවේ එබැවිනි.

***"සිංහල සිංදු කියන***
***නළලේ තිලක තියන කිරිල්ලී***
***තුඩින් හදවතක් අරගෙන***
***ගිනිගත් තල් අරඹට ආවාදෝ ඉගිල්ලී......"***

ජාතිවාදයේ යුදගිනි දැල්වල තාපයෙන් පරිපීඩිත වූ උතුරේ දෙමළ හදවත්වල කකියන වේදනාව දකුණේ මිනිසුන්ට තේරෙන සිංහලයට නැගීමට හැකියාව ඇත්තේ එසේ තම සැබෑ ප්‍රේමය වෙනුවෙන් කටුඅකුල් පවා සිපගත් කිරිල්ලකට නොවේ ද? ඒ නිසා කිසිඳු ආගමකට, කිසිඳු ජාතිකත්වයකට යටත් නොවූ සැබෑම සුන්දර මානව ප්‍රේමයක් රැකෙන්නේ ද එවැනිම හදවතක් තුළ නොවේ ද?

***"......ගිනි අවිත් එක්ක පෙමින් බැඳුණු***
***විහඟ සෙනඟ හඬාවී***
***ඒ කඳුළු සිංහලට නගන්න***
***නුඹට හැකිය ප්‍රියාවී***
***ආදරය නුඹට බාරයි***
***රැකගනින් දේවතාවී"***

සැබවින්ම එවැනි සුන්දර ප්‍රේම කථා ගැන මෙන්ම සුන්දර මිනිසුන් ගැනත් අප විවිධ අවස්ථාවලදී අසා තිබෙනවා. ඒ සමහර මිනිසුන්ගේ මතකයන් විසින් අපේ සමාජය තුන්කල්හිම සුවඳවත් කරනවා. තවත් බෝ කාලයක් මේ මිනිස් සමාජය සිසාරා මනුසත්කමේ සුවඳ පතුරුවාලන්නයි ඔවුන් බලා සිටියේ. නමුත් ඒ සැබෑ මිනිසුන්ගේ උණුසුම් ප්‍රාණවායුන්ගෙන් වාතලය පුරවාලමින් හිත්පිත් නොමැතිව ගලාගිය රුධිර ගංඟාවගෙන්
මේ පොළෝතලය පෙඟී ගිය ඉතිහාසයකුයි අපට ඇත්තේ. සෞම්‍ය සඳරුවන් කවියාගේ "මේ මෙතැන මල්පඳුර පැළවුණු තැන" පද්‍ය පංතිය පුරාම හුස්ම ගන්නෙත් ඒ වගේම මිනිසෙක්. රාමචන්ද්‍රන් මාස්ටර් දෙමළ. ඔහු ඉගැන්වූවේ ඉංග්‍රීසි. ඒ වෙනකාටවත් නොවෙයි, සිංහල දරුවන්ටයි. ඒත් කිසිම ජාතියක්, ආගමක් නොහඳුනපු, ඒ වෙනුවට මනුස්සකම විතරක් දෝත දරාපු මාස්ටර්ව දවාහළු කරන්න ජාතිවාදී මෘගයන්ට හැකි වෙනවා. සෞම්‍ය ඒ ගැන තමන්ගේ හිතේ තියෙන වේදනාව කියන්නේ මෙහෙමයි.

***"....සිංහල ද දෙමළදැයි***
***නොදන්නා මිනිස්කම***
***සිංහලෙන් ඉගැන්වූ***
***දෙමළ හිත......***
***රාමචන්ද්‍රන්,***
***ඉංග්‍රීසි මාස්ටර්***
***නිදා හුන් තැනය මෙය,***
***පිළිස්සී අලුරු වුණු ඒ සිරුර,***
***වැටී තිබුණේ මෙතැනය......"***

රාමචන්ද්‍රන් ඉංග්‍රීසි මාස්ටර් වැනි සිංහලත් නොවන, දෙමළත් නොවන, මුස්ලිමුත් නොවන සැබෑ මිනිසුන් ඉදිරියේ දුහුවිල්ලක් තරමටවත් වටිනාකමක් නොමැති, ජාතිවාදයේ හා ආගම්වාදයේ අන්ත ගෝත්‍රිකවාදී අදහස් කරපින්නා ගත් උන් අදත් අප අතර ඕනෑතරම් සිටී. ජාති භේද තුට්ටුවකට හෝ මායිම් නොකළ රාමචන්ද්‍රන් මාස්ටර් වැනියවුන්ගේ මනුස්සකම් පිළිබඳව අපට නැවත නැවතත් කථා කරන්නට අවශ්‍යව ඇත්තේ ද ඒ නිසාවෙන්මය.

සෞම්‍ය කවියාගෙම "සිවා, මේ කව නුඹට ය..." පද්‍ය පංතිය තුළින් ඉස්මතු කෙරෙන සුන්දර මිනිසෙකු පිළිබඳව දැක්වෙන පද පේළි කිහිපයකුයි මේ.

***"දෙවියෙක් වුනත් දෙමළෙක්"***
***කියා දකුණේ නෑයෙක්***
***මූණටම කී දවසෙත්***
***සිනහව නොවී අඩුවක්,***
***"මිනිස්සුනේ අපි ඔක්කොම...?"***
***කියූ සුන්දර පපුවක්"***

තමන්ගේ ජාතිකත්වය පිළිබඳ අතිශය මාන්නයක් හිසේ රුවාගෙන තවත් ජාතිකත්වයක් කෙරෙහි වචනයකින් පවා රිදවීමට උත්සාහ දරන මාන්නක්කාර ජාතිවාදී උන්මත්තකයින් අතරේ මිනිස්කමෙන් හද පුරවා ගත් එවැන්නෙක් කෙරෙහි හිත බැඳී යාම අරුමයකැයි කිව හැක්කේ කාට ද?

සෞම්‍ය ඉස්මතු කරන සිවාගේ වේදනාව ගැන දකුණේ ඥාතියාට නොදැනීම සම්බන්ධයෙන් මංජුල වෙඩිවර්ධන කවියා හරි අපූරුවට මතු කරනවා.

***"මා ඉදිරියේ හිස් කඩදාසියකි***
***ඒ මත ලේ පැල්ලමකි***
***ඒත් එය දෙමළෙනි***
***සිහලුන්ට නොතේරෙන්නේ එබැවිනි"***

ඉඳින් සිංහල හෝ වේවා, දෙමළ හෝ වේවා, මුස්ලිම් හෝ වේවා, අප කාටත් එකිනෙකාගේ වේදනාව නොදැනෙන්නේ නම්, සතුට නොවටී නම් එතැන දී අප අපගේ මිනිස්කම පිළිබඳව නැවත සිතාබැලිය යුතුය. සැබවින්ම අප කවුරුත් ජාති, ආගම්, කුල අනුව බෙදෙන්නට පෙර එකම මිනිස් කුලයකට අයත් වූ බව සිහි තබාගත යුතුය. මේ සියලු බෙදීම් අප හිස් මත පතිත කොට ඇත්තේ අප අතර වන සැබෑ බෙදුම් රේඛාවන් මිත්‍යාවේ මිහිදුමෙන් වසා දැමීම වෙනුවෙනි. මේ සැබෑ රේඛාවන් හඳුනා නොගන්නා තෙක් උතුරට වෙනමත්, දකුණට වෙනමත්, නැගෙනහිරට වෙනමත් වසන්තය උදා වෙන තෙක් බලා සිටීමට අප සැම පෙළඹී ඇත්තේය.

***".....මල් පිපී ඇතත් පින්තූරෙක උතුරේ***
***"වසන්තම්" දුරයි අපි කාටත් මිතුරේ..."***

ඉතින්.... එන්න, අපි මේ මුළු රටටම වසන්තය උදා කරමු!

# මරණයට අභියෝග කළ "සැබෑ මිනිසෙකුගේ කතාවක්"



Super man, Spider man, හෝ Harry Potter යනු බහ තෝරන කල් සිටම බොහෝ දරුවන් අබියස විස්කම් පානා ඔවුන්ගේ වීරයෝ වෙති. ඉනික්බිතිව එකී චරිතයන් පරාරෝපණය කොටග නිමින් සැබෑ ජීවිතය තුළ වීරයින් වීමට බහ තේරූ වයස්වල උන් පවා කල්මරති. සැබෑ ජීවිතවල හරය වසන්කොට නෙක මායාවන්ගෙන් දෙනෙත් අඳ කරනු ලබන මෙවන් සමාජයක, එහි ඉදිරි ගමනට උරදුන්, මිහිපිට සැබෑ වීරයින් සොයාගිය ගමනක තවත් එක් නවාතැනකි, "සැබෑ මිනිසෙකුගේ කතාවක්". රුසියානු සාහිත මුවදොරින් ජනිත වූ මෙම නවකතාවේ පබැඳුම රුසියානු ලේඛක බරිස් පලෙවොයි විසිනි. එහි අනුවාදය දැදිගම වී. රුද්‍රිගු විසිනි.

ඇලෙක්සෙයි මරේසියෙව්, මීට දශක ගණනාවකට පෙර ඇවිළුණු දෙවන ලෝක සංග්‍රාමයේදී හිට්ලර්ගේ යුද සේනාංකවලට එදිරිව සටන් කළ සමාජවාදී සෝවියට් ප්‍රහාරක හමුදා ගුවන් නියමුවෙකි. ඔහු තවත් එක් යුද සෙබළෙකු හෝ තවත් එක් මිනිසෙකු පමණක් නොවන්නේ මිනිස් බව පසෙකලා දිවෙන, ලේ දියට ලොල්, ම්ලේච්ඡ වූත් අතිප්‍රබල වූත් යුද සේනාවක් ඉදිරියේ, මිනිස්කම් සශ්‍රීක, වඩා දියුණු හා යහපත් සමාජයක් සුරක්ෂිත කිරීම නම් වූ ඒ උදාරතර අභිලාෂය මත පිහිටුවමින් අභීත ලෙස සටන් කළ හා අතිවිශිෂ්ට ලෙස දස්කම් පෑ සැබෑ වීරයෙකු වූ නිසාවෙනි.

"කකුල්වලින් ව්‍යායාම් කිරීම තියුණු වේදනාවක් ගෙන දුන්නේය. එහෙත් ඇලෙක්සෙයි දැඩි අදිටනකින් යුතුව දිනපතාම ව්‍යායාම් කිරීමේ කාලය විනාඩියකින් වැඩි කළේය. ඒ වැඩිපුර විනාඩිය ඔහුට තියුණු වේදනාවක් ගෙන දුන්නේය. දෑසින් කඳුළු කැට වැටිණ. තොල් රත් පැහැවිය. කෙඳිරිගෑම මැඩපවත්වා ගනු වස් දෙතොල් සපාගන්ට වූයෙන්, ලේ රසය පවා දැණිනි. එහෙත් හේ පසු නොබැස්සේය..."

බාහිර සමාජය පමණක් නොව, තම සිරුර පවා 'නැවතීමකට' බලකරන මොහොතක, ඉන් නොසැලී තම ජීවිතයටද අභියෝග කරමින් ඔහු සිය යහපත් අරමුණ වෙනුවෙන් නොසැලී ඉදිරියට යන්නේ කිසිවකට හෝ වැළකිය නොහැකි වූ උදාරතර අරමුණු පෙරදැරිකොට ගත් දැඩි ආත්ම විශ්වාසයකිනි.

"ජ්‍යෙෂ්ට ලුතිනන් මා හමුවන්නටද ආවේ....? තමුසෙ ඉල්ලා සිටින්නේ මොකක්ද?

''ප්‍රහාරක අහස් යානා සේනාංකයට පත්වීමක්...''

''තමුසෙට අහස්යානා පදවන්ට බැහැ නෙව?''

''මට පුළුවනි. මම අහස්යානා පදවනවා.''

''මේ අහනවා. කකුල් නැතිව කොහොමද ඔය වැඩේ කරන්නේ? පිස්සුවක් නෙව.. කවදාවත් අහල තියෙනවද?...''

''මීට ඉස්සෙල්ලා අහලා නැතුවට මීට පස්සේ අහවි."

වාරු නොවූ පා මරණයට වෙණ වයද්දී ඉන් අවදිව නැවත යුද පෙරමුණට ගොස් සටන්කිරීම දක්වා ඔහු සිය දෛවය මෙහෙයවන්නේ මිනිසාට සේවය කිරීම නම් වූ උතුම් අරමුණ වෙනුවෙන් එදා මෙදාතුර කැපවූ සැබෑ මිනිසුන්ගේ අප්‍රතිහත ධෛර්යය මොනවට පසක් කරමිනි.

"පෙත්රොව්, නුඹ ජීවතුන් අතර, නුඹ... නුඹ හරිම යක් පැටියෙක්" යැයි ඇලෙක්සෙයි කීවේ පෙත්රොව්ගේ ගිලන් මැස්ස අසල දණ ගසමිනි. පෙත්රොව්ගේ හිස දෑතින් ගත් ඇලෙක්සෙයි වේදනාවෙන් පෙළෙමින් සිටි තම සගයා දෙස බලමින් මෙසේ කීවේය.

"නුඹ ජීවතුන් අතර"

ඇලෙක්සෙයි නුඹට ස්තූතියි. නුඹ මගේ ජීවිතය බේරුවා. නුඹට ස්තූතියි..."

ඔහු අභීත සටන් නියමුවෙකි; දයාබර මිතුරෙකි; සෙනෙහෙබර ආදරවන්තයෙකි... සුවහසකගේ යහපත් හෙට දවස වෙනුවෙන් මෙපිට අප විසින් 'දැකිය යුතු' සැබෑම වීරයින් විසින් පිදුණේ ඔවුන්ගේ ජීවිත පමණක්ම නොවේ. තම මානවීය හදවත් තුළ නැගි අතිශය සියුම් හැඟුමන් පවා ඔවුහු සිය අරමුණු වෙනුවෙන්ම කැපකළහ.

"ඔහු තම සාක්කුවෙන් ඕල්‍යාගේ පැරණි ඡායාරූපය ගෙන අලුත් ඡායාරූපය සමඟ සමකර බැලීය. මල්පාත්තියක් ළඟ පළාවන් ගවොමක් ඇඳ සිටින ඕල්‍යාට වඩා යුද ඇඳුමින් සැරසී සිටින, විඩාපත් ඇස් ඇති, තමා කිසිදිනෙක දැක නැති ඕල්‍යා තමාට වඩා කිට්ටු බවත්, වඩාත් වටිනා බවත් ඇලෙක්සෙයිට අවබෝධ විය..."

ජර්මානු හමුදා සමඟ යළි යළිත් සටන් වදිමින් සිය දේශය ජයග්‍රහණය කරා රැගෙන යාමට කැපවූ ඇලෙක්සෙයි මරේසියෙව් නම් වූ මෙම සොඳුරු මිනිසා, දෙවන ලෝක සංග්‍රාමයෙන් පසු "සෝවියට් සංගමයේ වීරයා" යන උත්තරීතර නාමයෙන්ද පිදුම් ලැබුවේය. එලෙස මිහිපිට දිනන සැබෑ වීරයෝ සිය අරමුණු සාක්ෂාත් කරගන්නා අතර ඉන් මතුවටත් ඒ බිම සශ්‍රීක කිරීම වෙනුවෙන් සැබෑ මිනිසුන් ලෙස සිය වගකීම අත්නොහරිති..! "සැබෑ මිනිසෙකුගේ කතාවක්", ෆැන්ටසි වීරයින් අදහන ලෝකයක සැබෑම වූ මිනිසෙකුගේ ජීවිතය ගෙනහැර පෑ විශිෂ්ට නිර්මාණයකි.

## සරදියෙල්ගේ කොලම

පසුගිය දා උසාවියේදී ඔප්පු වුණා, බනානා සුජීව ඇලෝසියස්ගෙන් ලක්ෂ 30ක් ගත්ත බව. ඇත්ත නැත්ත පොතේ ඇත්ත දැන් තමයි එළියට එන්නේ. පොරට ඒක මාට්ටුයි කියලා දැනගත්ත වේලේ හදවත හිරවෙන්න වගේ ආවලු. නැවත ඒ සල්ලි දෙන්නම්ලු. එහෙම කියලා පැය 24යි ගියේ, පොරගේ පක්ෂේ එකෙක් කියලා ගත්තේ නෑ කියන්න කියලා. එයා දන්නෙ නෑ, එයාට මතක නෑ වගේ ඒවා කියන්න කියලා. ''මගේ ආරක්ෂකයෙක් තමයි මාරු කරලා තියෙන්නේ. මම දන්නෑ, මෙන්ඩිස් එක ඇලෝසියස්ගේ කියලා. මගේ යාලුවෝ තමයි අරන් තියෙන්නේ. මං බබා.'' එකපාරටම චැනල් එක මාරු කරලා, මිනිහා සුදනා වුනා. ඕකේ වැරැද්ද තියෙන්නේ අපේ රටේ මිනිස්සුන්ගේ. උන් දන්නවා උන් මොන වැරැද්ද කළත්, ඡන්දේ කාලෙට හොඳට බොන්න දීලා සංගීතයක් දාලා දුන්නනම් ඡන්දේ ගොඩ කියලා.

ඒ අතරෙ තව කොහෙද ඉඳන් ගෙම්බෙක් බක බක ගෑවා. ''20ට මං බයයි. බක බක...... ගෝටා 20 ජනාධිපති බක බක...... ඒ නිසා 20ට මං විරුද්ධයි බක බක......'' දැන් කූජිත වෙලා ඉන්න මේ ගෙම්බා සිහින දකිනවා, 20 ගෝටාව පුටුවේ ඉන්දවලා එයාටත් ඇමති පුටුවක් වෙන් කරගන්න. ඉතින් කෑ ගහනවා. ''බක බක......එදා විවාදෙදි නීති විශාරද වෙන්න ගිහින් ඇදගෙන නෑවා. විවාදෙන් පස්සේ ටිකක් හුළං බැස්සා. ආයෙත් මෙන්න කට ඇරිලා...... ජම්පරේ ඇඳපු නානසාරට හිරබත් කන්න තරම් දඬුවමක් දීපු එක වැරදියිලු. එයා දන්න තරමින් නානසාර කළේ වැරැද්දක් නෙමෙයිලු. එයා දන්න තරමින් ඕස්ට්‍රේලියානු ආයෝජකයන්ගේ කොටස් හොරාට මංකොල්ල කෑමත් වැරැද්දක් නෙමෙයි වෙන්න ඇති එහෙනම්.

ලංකාවේ ඉන්න එක මහානායක හාමුදුරු කෙනෙක්ටවත් බැරි වුනානේ, සිවුර පොරවගෙන තක්කඩි දේශපාලකයින්ට කඩේ යන හොර මගෝඩියන්ගේ සිවුර ගලවලා ශාසනයට ආදර්ශයක් දෙන්න. රටේ නීතිය බල්ලට දාලා බීලා වාහන එළවලා අනතුරු සිදුකරලා වැරැද්ද පිළිගන්න වුණු, පංසලකටවත් වද්දගන්න සුදුසු නැති තක්කඩින්ට පක්ෂපාතීව කතා කරනවා. සිවුරේ අනුහස ලොකු කරගෙන ඔය චණ්ඩි පාට් දාන වෙලාවක ලොකු හාමුදුරු කෙනෙක්වත් විනය ක්‍රියාමාර්ගයක් නොගත්තකොට, උසාවියෙන් අච්චු වෙච්ච එකාට ජම්පරේ අන්දන්න එපාලු. සරදියෙල් අදහන බුද්ධාගමේ හැටියට නම් හාමුදුරුවරු සතුටු වෙන්න ඕනි, ශාසනේට අගෞරව වන විදියට දේශපාලකයන්ට තුරුල් වෙලා අසමත්ජාති විදියට හැසිරුණු එකාගේ සිවුර උසාවියෙන් හරි ගැලෙව්ව එකට.

නූතන සරදියෙල්



# ලංකාව ස්වභාවික ආපදා අතරින් ඉදිරියට

ශ්‍රී ලංකාව සමකය ආසන්නයේ පිහිටි ස්වභාවික ආපදා අවම, සෞම්‍ය දේශගුණයකට හිමිකම් කියූ රටකි. ස්වභාවික ආපදා අනුව ලොව රටවල් ශ්‍රේණිගත කිරීමේ දී 2015 වසර දක්වා 94 වන ස්ථානයේ සිටි ශ්‍රී ලංකාව 2018 වන විට එම ශ්‍රේණිගත කිරීමේ 04 වන ස්ථානය දක්වා ඉදිරියට පැමිණ ඇත. එයට ප්‍රධාන වශයෙන්ම පසුගිය වසර කීපය තුළ පැවති දැඩි නියං, ගංවතුර, නාය යෑම්, සුළි කුණාටු, මුහුදු රළ ප්‍රචණ්ඩ වීම වැනි තත්වයන් හේතු වී ඇත. පසුගිය වසර කිහිපය තුළදී සිදු වූ ස්වභාවික ආපදා තත්වයන් හේතුවෙන් මෙරටට අහිමි වූ මිනිස් ජීවිත සංඛ්‍යාවද දහසකට ආසන්නය.

වසර තුන හතරක් වැනි කෙටි කාලයක් තුළ ස්වභාවික පරිසරයෙන් ඇති වන හානි මෙතරම් ප්‍රමාණයකින් ඉහළ යාම පිළිබඳව සැබැවින්ම අප අවධානය යොමු කළ යුතුය. මේ සඳහා විශාලතම බලපෑමක් ඇති කරන පරිසර තත්වයක් ලෙස මිහිකත උණුසුම් වීම ප්‍රධානය. කාර්මීකරණය හේතුවෙන් වායුගෝලයට පිට වන කාබන් ඩයොක්සයිඩ්, සල්ෆර් ඩයොක්සයිඩ්, කාබන් මොනොක්සයිඩ් සහ මීතේන් වැනි වායූන් හේතුවෙන් වායුගෝලයේ ඇතිවන අසමතුලිතතාවයත්, ඒ හේතුවෙන්ම ඇතිවන වායුගෝලීය උෂ්ණත්වය ඉහළ යාමත් යන කරුණු මත හිම දියවීම හා ග්ලැසියර් දියවීම වැනි ක්‍රියාවලි රැසක් සිදුවේ. ඒ අනුව පෘථිවි ගෝලය තුළ ජල චක්‍රය ක්‍රියාත්මක වීමේ වෙනස්කම් රැසක් සිදුව පවතී. ග්ලැසියර් දියවීමත් සමඟම සාගර ජල මට්ටම ඉහළ යාමත්, ඒ සමඟම උදම් රළ ඇතිවීමේ වේගය වැඩි වීමත් සිදුවෙයි. සුළං තත්වයන් අනුව වැසි සහ කුණාටු තත්වයන් තීරණය වන අතර ඉන්දියන් සාගරයට ඉහළ වායුගෝලීය හැසිරීම මඟින් ශ්‍රී ලංකාවේ කාලගුණික හා දේශගුණික විපර්යාසයන්ට සෘජුවම බලපෑම් ඇතිකරයි.

මීට අමතරව රට අභ්‍යන්තරයේ පවතින පාරිසරික ගැටලු සහ ස්වභාවික සම්පත් විනාශ කිරීමද දරුණු ස්වභාවික ආපදා වෙත අතවැනීමක් වැනිය. දිනෙන් දිනම අඩු වන ස්වභාවික වන වැස්ම, නියං තත්ව ඇතිවීම කෙරෙහිත්, ගංවතුර සුළි කුණාටු ඇතිවීම කෙරෙහිත් සෘජුවම බලපායි. වන වැස්මක් සහිත භූමියකට වැටෙන වැසි බිඳු ප්‍රථමයෙන් ඉහළ වන වැස්මටත්, දෙවනුව පහළ වන වැස්මටත් පතිත වී තුන්වනුව පොළව මතුපිට ඇති කාබනික

> 1948 දී ඉංග්‍රීසීන්ගෙන් මෙරටට නාමික නිදහස ලැබෙන විට පවා ලංකා භූමියෙන් 60%ක පමණ වන ගහනයක් පැවතුණි. එදාමෙදා තුර සිදුකළ ඊනියා සංවර්ධනයේ හෝ වෙනත් මොනයම් හෝ හේතු මත මේ වන විට ලංකාවේ වන ගහණය 20%ක් තරම් අඩු වී ඇත.

ස්ථරය වෙත පතිත වෙයි. එය ක්‍රමානුකූලව පොළවට අවශෝෂණය කරගැනීම සහ භූ ගර්භයේ රඳවා ගැනීමත්, ක්‍රමානුකූලව නිදහස් කිරීමත් සිදුවෙයි. වනාන්තර ආශ්‍රිතව නොසිඳෙන දිය උල්පත් පවතිනුයේ ද එම ක්‍රියාවලිය හේතුවෙනි. වන වැස්ම ඉවත් වූ විට භූමියකට වැටෙන වැහි බිඳු සෘජුවම පොළව මතුපිටට පතිත වෙයි. එම වැහි බිඳු වේගයෙන් මතුපිට පස් සමඟ ගැටී පස් කුට්ටිත් රැගෙන පහත් ප්‍රදේශ වෙත වේගයෙන් ගලා බසියි. එයින් දැඩි පාංශු ඛාදනයක් සිදුවෙන අතර පොළවට ජලය අවශෝෂණය කරගැනීමේ හැකියාවද අවම වෙයි. එසේ වැසි ජලයත් සමඟ සෝදා යන පස් පහත් නිම්නයන්හි තැන්පත් වන අතර ගංඟා, වැව්, පොකුණු හා ජලාශ රොන් මඩින් පිරී යයි.

මීටත් අමතරව නාගරීකරණයත් සමඟ ඉදිවන ගොඩනැගිලි සහ මංමාවත් හේතුවෙන් පෘථිවි පෘෂ්ඨය කොන්ක්‍රීට් හෝ තාර වැනි ජලය පාරවිලයනය නොවන වැස්මකින් ආවරණය වී පවතියි. ඒ හේතුවෙන්ද නාගරික භූමීන්හි පොළව අභ්‍යන්තරයට ජලය අවශෝෂණය කිරීමේ හැකියාව වළකාලයි. එලෙස එම පෘෂ්ඨ මතුපිටින් ජලය ගලා යාම හේතුවෙන් තද වැසි අවස්ථාවන්හි දී ගංවතුර තත්ව ඇතිවෙයි. ක්‍රමානුකූලව ජලාශ සහ වැව් නඩත්තු නොකිරීමත්, වැව් පිට්ටනි ගොඩ කරමින් ගොඩනැගිලි ඉදිකිරීමත් වැනි අක්‍රමික මිනිස් ක්‍රියාකාරකම් ද ගංවතුර තත්වයන් ඇති කිරීම කෙරෙහි බලපෑම් ඇති කරයි.

වැසි සමයේ දී පස ජලයෙන් සංතෘප්ත නොවීමත්, වන වැස්ම ඉවත් වීම නිසා ජලය පස තුළ ගබඩා කරගැනීමේ හා ක්‍රමානුකූලව ජලය නිදහස් කිරීමේ ක්‍රියාවලිය බිඳවැටීමත් සිදුව ඇති බැවින් මාස කිහිපයක් තිස්සේ හිරු රැස් වැටීමේදී දැඩි නියං තත්වයක් ඇති වෙයි. නියඟය හේතුවෙන් කෘෂිකර්මාන්තය බිඳවැටෙන අතර ගොවියාගේ ආර්ථික හැකියාව ද ඉන් අහිමි කෙරේ. මේ නිසා ජලගැලීම් හා නාය යෑම් නිසාවෙන්ම කෘෂි ආර්ථිකය හා සාමාන්‍ය ජන ජීවිතය බිඳ දමයි.

1948 දී ඉංග්‍රීසීන්ගෙන් මෙරටට නාමික නිදහස ලැබෙන විට පවා ලංකා භූමියෙන් 60%ක පමණ වන ගහනයක් පැවතුණි. එදාමෙදා තුර සිදුකළ ඊනියා සංවර්ධනයේ හෝ වෙනත් මොනයම් හෝ හේතු මත මේ වන විට ලංකාවේ වන ගහණය 20%ක් තරම් අඩු වී ඇත. එවන් පසුබිමක ස්වභාවික පාරිසරික හේතූන් මත මිනිසාට ඇති වන අහිතකර විපාකයන් ප්‍රමාණයද වැඩි වී තිබේ. එබැවින් පාරිසරික තුලනය ලෝකයේ පැවැත්ම කෙරෙහි සුවිශේෂී කාර්යයක් ඉටුකරන අතර ස්වභාවික විපත් ඇතිවීම කෙරෙහිත් පාරිසරික අසමතුලිතතාව සෘජුවම බලපාන බවද මිනිස් සත්වයින් විසින් සිහි තබාගත යුතුව ඇත.

## වෙනිසියුලානු කොමියුනිස්ට් තරුණ සංගමය හා SYU අතර සාකච්ඡා

වෙනිසියුලානු කොමියුනිස්ට් තරුණ සංවිධානය (JCV) සහ සමාජවාදී තරුණ සංගමය (SYU) අතර හමුවක් පසුගිය මැයි 29 දින සමාජවාදී තරුණ සංගම් මූලස්ථානයේ දී පැවැත්වීය.
මේ සඳහා වෙනිසියුලානු කොමියුනිස්ට් පක්ෂයේ තරුණ සංගමයේ ප්‍රධාන ලේකම් හෙක්ටර් අප්ලෝ සහෝදරයා සහ එහි ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ලේකම් ගේබ්‍රියල් සහෝදරයා සහභාගී විය.
මේ අතර වෙනිසියුලානු කොමියුනිස්ට් තරුණ සංගමයේ ඉල්ලීම මත සමාජවාදී තරුණ සංගමය විසින් සංවිධානය කළ මිත්‍රත්ව වැඩසටහන මැයි 29 සිට ජුනි



03 දක්වා පැවැත්වූ අතර එහිදී අත්දැකීම් හුවමාරු වැඩසටහන්, තරුණ වැඩමුළු, තරුණ ක්‍රියාකාරී හමු සහ දේශපාලන සාකච්ඡා ආදී වැඩසටහන් රාශියක් ද සංවර්ධනය කොට තිබුණි.

Sports

# ලොව දිනූ කනිෂ්ඨයෝ




18 වැනි ආසියානු කනිෂ්ඨ මලල ක්‍රීඩා උළෙල පසුගිය ජුනි 7 වනදා සිට පුරා සිව් දිනක් තිස්සේ ජපානයේ දී පැවැත්විණි. වර්ෂ 1986 දී පළමු වන ආසියානු කනිෂ්ඨ මලල ක්‍රීඩා උළෙල ඉන්දුනීසියාවේ දී පැවැත්වීය. මෙවර ආසියානු මලල ක්‍රීඩා තරඟාවලිය සඳහා තරඟවැදීමට රටවල් 35ක් නියෝජනය කිරීමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් රැසක් සහභාගී වූහ.

ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 13 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් ඉකුත් 05 වන දා ජපානය බලා පිටත් වූයේ සිය මව්බිම වෙනුවෙන් වූ දහසකුත් එකක් බලාපොරොත්තු පොදි බැඳගෙනයි. ඒ මෙතෙක් පදක්කම් සටහනේ 16 වන ස්ථානයේ පසු වූ ශ්‍රී ලංකාව තවත් ඉහළට ඔසවා තැබීමටයි. අපේක්ෂාවන් මල්ඵල ගන්වමින්, ඔවුන් වාර්තා පිට වාර්තා බිහිකරමින්, සමස්ත ශූරතාවලියේ 05 වැනි ස්ථානය ලබාගැනීමට වරම් ලැබුයේ රන් පදක්කම් 03ක්, රිදී පදක්කම් 04ක් හා ලෝකඩ පදක්කම් 02ක් ද ඇතුළුව මුළු පදක්කම් 09ක් සිය මව්බිමට හිමිකර දෙමිනි. එහි ප්‍රථම ස්ථානය සමස්ත පදක්ම් 42ක් ජයග්‍රහණය කළ ජපානය හිමි කරගත් අතර දෙවන හා තෙවන ස්ථාන හිමිකරගත් චීනය හා ඉන්දියාව පිළිවෙළින් පදක්ම් 23ක් හා 17ක් බැගින් දිනාගත්හ.

සුදුසුකම් ලබාගැනීමේ තරඟ සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ආරම්භක ක්‍රීඩිකාව ලෙස ඩිල්ෂි කුමාරසිංහ මීටර් 400 කාන්තා ඉසව්වට සහභාගී වූවාය. එහිදී තාක්ෂණික දෝෂයක් නිසා තරඟ ආරම්භය ගැනීමට ප්‍රමාද වුවද සියල්ලන්ම අබිබවමින් ඇය එම තරඟය අවසන් කළේ ප්‍රථම ස්ථානය දිනාග නිමිනි. කනිෂ්ඨ අංශයේ සිටින දකුණු ආසියාවේ වේගවත්ම ධාවන ශූරියක වන අමාෂා ද සිල්වා තත්පර 11.8ක කාලයක් තුළ සිය තරඟ ඉසව්ව නිමා කළේ ද තම මලල ක්‍රීඩා දිවියේ හොඳම පුද්ගලික තරඟ කාලය වාර්තා කරමිනි. ශ්‍රී ලංකාවේ සිටින තවත් දක්ෂ යොවුන් මලල ක්‍රීඩකයින් දෙදෙනෙකු වන අරුණ දර්ශන හා පසිඳු කොඩිකාර ද සුදුසුකම් ලබාගැනීමේ තරඟ ඉසව්වලදී කැපීපෙනෙන ලෙස සිය දස්කම් පෑහ. මෙලෙස ශ්‍රී ලාංකික ක්‍රීඩකයින් සුදුසුකම් ලබාගැනීමේ තරඟවලදී පවා සිය උපරිමය හෙළි කළේ අවසාන මහ තාරඟාවලියේදී ඔවුන් ලද ජයග්‍රහණවල පෙර නිමිති පළකරමිනි.

මේ අතර මීටර් 400 බාලක අවසන් මහා තරඟය සඳහා තරඟ කළ අරුණ දර්ශන හා පසිඳු කොඩිකාර ද ආරම්භයේ සිටම ධාවන පථය තම අණසක යටතට ගත්හ. එහිදී තම හොඳම පෞද්ගලික කාලය ලෙස තත්පර 45.79 කින් තරඟය නිමා කළ අරුණ දර්ශන සිය මව්බිම වෙනුවෙන් ප්‍රථම රන් පදක්කම දිනාගැනීමට සමත් විය. 2016 වසරේ රොහාන් ප්‍රදීප්ගෙන් පසුව ශ්‍රී ලංකා ක්‍රීඩකයෙකු තත්පර 46යේ සීමාව බිඳහෙළූ ප්‍රථම අවස්ථාව මෙය වන අතර 2018 වසරේ සියලු ධාවකයන් අතර ආසියාවේ සයවැන්නා බවට ද පත්වෙමින් නව තරඟ වාර්තාවක් ද තැබීමට සමත් වූයේ ශ්‍රී ලංකා කනිෂ්ඨ ජාතික වාර්තාවද බිඳදමමිනි. පසිඳු කොඩිකාරද තත්පර 46.93ක කාලයක් වාර්තා කරමින් එම ඉසව්වේම රිදී පදක්කම ශ්‍රී ලංකාවට දිනා දීමට සමත් විය.

මීටර් 400 බාලිකා තරඟයේදී ඩිල්ෂි කුමාරසිංහ රිදී පදක්කමක් දිනා ගැනීමට සමත් වූ අතර ඇය තරඟය තත්පර 54.03ක කාලයකින් නිමාකරමින් සිය හොඳම පෞද්ගලික කාලය ද වාර්තා කළාය. මීටර් 800 බාලිකා ඉසව්ව 2:04:53ක කාලයක් තුළ නිමාකරමින් එහිදීද තම හොඳම පෞද්ගලික දක්ෂතාව පිළිබිඹු කරමින් ඩිල්ෂි එම ඉසව්ව සඳහා ලෝකඩ පදක්කමක් දිනාගන්නේ නව ශ්‍රී ලංකා කණිෂ්ඨ ජාතික වාර්තාවක්ද පිහිටුවමිනි.

සියල්ලන්ගේම අවධානය නතුකර ගනිමින් පැවැත් වුණු මීටර් 100 බාලිකා තරඟයේදී, ඒ වනවිටත් කාගේත් කතාබහට ලක්වුණු ක්‍රීඩිකාවක වන ෆෙන්ග් ලූලූ හා උරෙන් උර ගැටෙමින් තරඟ කළ අමාෂාට රන් පදක්කම අහිමි වූයේ තත්පර 0.3ක් වැනි ඇසිල්ලක පමාවෙනි. එහෙත් තම හොඳම පෞද්ගලික කාලය වාර්තා කරමින් අමාෂා සිය තරඟය තත්පර 11.71කින් නිමා කළේ රිදී පදක්කමක් ජයග්‍රහණය කරමිනි.

මීටර් 3000 බාලිකා බාධක දිවීමේ ඉසව්ව සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කළ 17 හැවිරිදි පාරමී වසන්ති ද සිය මව්බිම වෙනුවෙන් රන් පදක්කමක් දිනාදීමට සමත් වූවාය. ඇයගේ හොඳම පෞද්ගලික කාලය ලෙස 10:21:54 කින් ඉසව්ව නිමා කළ ඇය ශ්‍රී ලංකාව වෙනුවෙන් සය වැනි පදක්කම දිනා දීමට සමත් වූවාය.

මෙලෙස ශ්‍රී ලංකාව ආසියානු මලල ක්‍රීඩා උළලේ ඉහළට ඔසවා තැබීමට අනේක ලෙස කැප වූ කනිෂ්ඨයින්ට මලල ක්‍රීඩාව තුළ ජයග්‍රහණයේ කිරුළු දිනාගැනීමට තව තවත් ධෛර්යය ලැබේවායි forward හි අපි මෙලෙස සුභපැතුම් එක් කරන්නෙමු.

## WFDY මහාමණ්ඩල රැස්වීමට SYU හා SSU නියෝජිතයින්

ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනයේ මහාමණ්ඩල රැස්වීම මැයි 23 සහ 24 යන දිනයන් හි නේපාලයේ දී පැවැත්විණි. ඒ සඳහා සමාජවාදී තරුණ සංගමය නියෝජනය කරමින් එහි ජාත්‍යන්තර කටයුතු පිළිබඳ ලේකම් අංජන අමරසිංහ සහෝදරයා සහ එහි ජාතික කමිටු සමාජික wfdy හි උප සභාපති වෛද්‍ය ලසන්ත අබේවර්ණ සහෝදරයා සමඟින් සමාජවාදී ශිෂ්‍ය සංගමය නියෝජනය කරමින් එහි ජාත්‍යන්තර කටයුතු පිළිබඳ ලේකම් මධූ කල්පනා සහෝදරියද සහභාගී විය. එහිදී



ශ්‍රී ලංකාවේ කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය හරහා රජය මඟින් අධ්‍යාපනය පෞද්ගලීකරණය උදෙසා හමුදාව යොදාගැනීමට දරණ උත්සාහය හෙළා දැකීමේ යෝජනාවක් ඉදිරිපත් කරන ලදී.

# කවි නිර්මාණය

**ඔබගේ නිර්මාණ සඳහා ඉඩක්**
ඔබගේ කවි නිර්මාණ අප වෙත එවන්න.
අප සූදානම් ඔබගේ නිර්මාණ සඳහා ඉඩක්
FORWARD කවි පිටුවේ වෙන්කරන්න.
මෙන්න අපගේ ලිපිනය

*FORWARD කවිපිටුව,*
*අංක 464/20, පන්නිපිටිය පාර,*
*පැලවත්ත, බත්තරමුල්ල.*

## අමුතු රස්සාවක් මේක...

දිනක් ආවම පන්සීයක් ගෙවන
දිනක් නාවොත් දෙදාස් පන්සීයක් කපන
දිවා රෑ මැෂින් එක උඩ ගෙවෙන
අමුතු රස්සාවක් මේක....
ලොකු එවුන් ඒ සීවල නිදන
අපේ ජීවිත උන්ගෙ සැපටම දියවෙන
අපි මහන තොරොම්බල් සළුවෙන්ම
උන් අපිව අන්දන අපූරුව....

**] හිරුමාලි දිසානායක - අනුරාධපුර [**



## චාරිකාව...



තට්ටේ ගෑ කඳුරැල්ල
එක දිගට පයිනස්...
කප්පාදු තේ - රබර්...
ඔළුවෙ මිටි පොදි බැඳන්
වැස්සෙ තෙමනා ළඳුන්...
පෙරළෙයි ගල් මුල් ද පහළට
දෙවිදත්වත් ද කන්ද උඩ ?
හුස්ම ගෙන ඉහළට
පෑගුවා අසූවට....!
වෙහෙස දැනුනම හිටිගමන්...
නැවතුනා සුරතලී බලන්
ඇල්ල වතුරත් හිරකරන්...
ඉල්ලුවා විසි තිස් ගණන්....!
හිල්වුණ පාත්තරේ අරන්
උඹ බලන්නට එන ගමන්....
සිනාසෙන අපෙ මතක අතරට
මෙහේ වෙනසක් දැණුනා බන්....
මානවයෝ, උඹ බලංගොඩමද ?
බලං තව විපරං කරන්....
උඹත් ගම රට වෙනස් කරලද?
මෙහේ මිනිසුන් තොග පිටින්....!

**] මියැසි රසාංජලී - රුහුණු විශ්වවිද්‍යාලය [**



## දහක් මල් පූදිනු ඇත...

කරගැට බිඳී මිරිකෙන
ප්‍රාණවල සාරය
උරා ගිජුලිහිණියන්
වපුරා අහස කළුවර
අඳ කළ අන්ධකාරය......
මළවුන් ගගා අතපත
සොයති - ඇහිඳිති
අහිමි වූ උන් - උන්ගෙ ප්‍රාණය.....
නොවැටී එලෙස දණ
දවා නුඹෙ හුස්ම
පොළොව සිප නැගී
පහන්සිල නුඹ......
නුඹ දුන් එළිය ගිර
ඉඳින් පායා රතු ඉර...
එළිය කර පෙරඹර
දහසක් පණ ලැබුවාය මිහිපිට....
තබා අරමුණ හද
සපථ කරනෙමු නුඹ ළඟ
නුඹ තැනූ බිම
දහක් මල් පූදිනු ඇත........!

**] රසාංජලී - අනුරාධපුර [**

## යසෝදරාවෝ...

යසෝදරාවෝ
ඉපදුණේ නෑ මැදුරක
ඈ උන්නෙ ගෙපැලේ
පුතු එක්ක තනියම....
දවාලක් රැයක් නැති
පිරිමින්ගේ කඳන් යට
හදවතේ පණ ඉතිරි වෙද්දි
ඇගේ මස් දිය වුණා හෙමිහිට....
සිදුහත්ගෙ මතකය
පපුතුරේ සඟවගෙන
පුතුගෙ බණ්ඩිය පුරෝලන්නට
ඉහිළුවා ඇය බිම්බරක් හිරිහැර....
දැන් ඉතින් ඈ වියපත් ය
ළඟදි හමුවුණා මා හට
ඈ උන්නේ ගෙපැලේ
පුතු නැතිව තනියම....

**] සඳුනි නුවන්තිකා - කොළඹ [**

## නුඹ නමින්...

ඉගිල යන්න
හැකිය නුඹට
හිතුමතේ
නිදහසේ
මතු දිනේ...
වෙහෙසී
දැවි දැවී
තනන්නේ අපි
මාවතක්
නුඹටයි
හෙට දිනේ
මිහි මතේ...

**] ලිහිණි වත්සලා - කුරුණෑගල [**

## අම්මා...

ඉරුණු ජීවිතය
මැසූ
ඉඳිකටුව
නුඹ....
ඔහු
ගොතා දුන්
නූල් පොට
ගෙන....

**] දිනූෂ පරණවිතාන - හම්බන්තොට [**



# සමාජ පෙරළියකට අවශ්‍ය මිනිසුන් තැනීමට කලාවට පුළුවන්

සංජීව පුෂ්ප කුමාර

### ඔබව හඳුන්වා දෙන්න කැමති කොහොමද?

මගේ නම සංජීව පුෂ්ප කුමාර. මම වෘත්තියෙන් චිත්‍රපට අධ්‍යක්ෂකවරයෙක්. ඊට අමතරව ජයවර්ධනපුර හා කැළණිය විශ්වවිද්‍යාල දෙකෙහි බාහිර කථිකාචාර්යවරයෙක් ලෙසත් කටයුතු කරනවා.

### ඔබ කලා ක්ෂේත්‍රයට පිවිසුණේ කොහොමද?

මම ත්‍රිකුණාමලයේ සිට කොළඹට පැමිණෙන්නේ නිවේදකයෙකු වීම සඳහායි. එහිදී මම සවන රේඩියෝ නාලිකාවේ සහ රූපවාහිනියේ කෙටි කලක් නිවේදකයෙකු වශයෙන් කටයුතු කරනවා. ඒ අතර වාරයේදී සිරස ආයතනයේද සේවය කරනවා. ඊටත් අමතරව වැඩසටහන් අධ්‍යක්ෂකවරයෙකු ලෙසත්, පුවත්පත් සඳහා ලිපි ලියන්නෙකු ලෙස රාවය පුවත්පත සමඟත් කටයුතු කරනවා. පසුව චිත්‍රපට සංස්ථාවේ සිනමාකරණය පිළිබඳ පාඨමාලාවක් හදාරා 2007 වසරේ දකුණු කොරියාවේ බොන්ජු හිදී සිනමාකරණය හදාරනවා. පසුව දකුණු කොරියාවේ චුන්දන් විශ්වවිද්‍යාලයෙන්ද සිනමාකරණය පිළිබඳ හදාරනවා. පශ්චාත් උපාධිය සඳහා බූසාන් සිනමා ඇකඩමිය හා සම්බන්ධ වෙනවා.

### ලංකාවේ සිනමා ක්ෂේත්‍රය ගැන ඔබගේ විග්‍රහය මොකක්ද?

අතීතයේ දී අපට හොඳ සිනමා කර්මාන්තයක් තිබුණා. හැබැයි දැන් නේපාලය, භූතානය හා බංගලාදේශයටත් පිටුපසින් තමයි අපේ සිනමාව තිබෙන්නේ.

> සිනමාහල් හිමියා තමාට අවශ්‍ය සිනමාපටය අධ්‍යක්ෂකවරයා ලවා කරගන්නා තැනට පත්වෙලා. සිනමාහල් බණ මඩු බවට පත්වෙලා. රජ කථා, ළමා චිත්‍රපට්වලින් තමයි සිනමාහල් දුවන්නේ.


මොකද අද වන විට ලාංකීය සිනමාවේ රැඟුම් පාලක මණ්ඩලය බවට මේ රටේ සිනමාහල් හිමියන් පත් වී ඇති බවක් තමයි දක්නට ලැබෙන්නේ. සිනමාහල් හිමියා තමාට අවශ්‍ය සිනමාපටය අධ්‍යක්ෂවරයා ලවා කරගන්නා තැනට පත්වෙලා. සිනමාහල් බණ මඩු බවට පත්වෙලා. රජ කථා, ළමා චිත්‍රපට්වලින් තමයි සිනමාහල් දුවන්නේ. ඔවුන්ට ඕනා කරන්නේ ඒ හරහා මේ රටේ ඉන්නා උපාසකම්මලා හා ළමුන් මෙන්ම දෙමව්පියනුත් සිනමාහල් තුළට කැඳවාගැනීමටයි. අපේ රටේ පුහුණු ප්‍රේක්ෂක පිරිසක් නොමැති වීම හා සිනමාව පිළිබඳ පැහැදිලි අධ්‍යාපනයක් නොමැති වීමත් මේ තත්වයට බලපා තිබෙනවා. එසේම රජයේ පාර්ශවයෙන් මේ කෙරෙහි කිසිම මැදිහත්වීමක් නොකර සිටීමක් තමයි දක්නට ලැබෙන්නේ. මෙය සිනමාව පමණක් නොව සියලු කලාවට අත් වී තිබෙන පොදු ඉරණමයි. සාක්ෂරතාවය ඇති නොකරන තාක් කලාව කඩාවැටීම වැළැක්විය නොහැකියි.

### කලාව ගැන ඔබට යම් අදහසක් ඇතිනේ. ඒ ගැනත් සඳහන් කෙරුවොත්.

සිනමාපටයක් නොබලා, සිම්ෆනියක් අහන්නේ නැතිව, පොතක් කියවන්නෙ නැතිව දවස ගෙවන එක මටනම් අමාරු කාර්යයක්. මගේ ජීවිතය පදනම් වෙලා තියෙන්නේම කලාව මතයි. මම හිතන්නේ මිනිස්සුන්ගේ මනුෂ්‍යත්වයේ පැවැත්ම සඳහා කලාව භාවිතයෙන් විශාල සංවාදයක් ගොඩනැගිය හැකියි. මනුෂ්‍යත්වය ගැන හැඟීම් ඇවිලවීම සඳහා කලාව භාවිතා කළ හැකියි.

### කලාව තුළින් සමාජ පෙරළියක් කළ හැකිද?

ඒක ටිකක් සැක සහිතයි. හැබැයි කලාව භාවිතය තුළින් එක් එක් පුද්ගලයින්ගේ ඥාන මණ්ඩලයට හා හැඟීම් පද්ධතියට බලපෑම් කළ හැකියි. මෙහි බලපෑම මනෝමූලිකයි. නමුත් සමාජ පෙරළියක් කරන්න අවශ්‍ය මිනිසුන් සූදානම් කිරීමේ කාර්යය පොහොසත් කිරීමට කලාවට හැකියාවක් තියෙනවා.




### මෙතෙක් ආ ගමනේදී ඔබට ලැබුණු සම්මාන ගැන සඳහන් කළොත්...

මම දැනට නිර්මාණ දෙකක් පමණයි සිදුකර තිබෙන්නේ. මේ මෑතකදී කළ දැවෙන විහඟුන් සිනමාපටය සඳහා ස්විට්සර්ලන්තයේදී හොඳම සිනමාපටයට හිමි සම්මානයත් ලොස්ඇන්ජලීස් චිත්‍රපට උළෙලේදී හොඳම නිළියට හිමි සම්මානයත් හිමි වුණා. ඊට අමතරව මගේ කලින් නිර්මාණය වූ ඉගිලෙන මාලුවෝ චිත්‍රපටය සඳහා ද සම්මාන ලැබී තිබෙනවා. හැබැයි මම නිර්මාණ කරන්නේ සම්මාන සඳහා නෙවෙයි.

# වෙනිසියුලානු තාරුණ්‍යයේ පෙරමුණු බළඇණිය - JCV



වෙනිසියුලානු කොමියුනිස්ට් තරුණ සංගමය (JCV) 1947 දී පිහිටුවන ලද අතර එය වෙනිසියුලානු කොමියුනිස්ට් පක්ෂයේ (PCV) තරුණ සංවිධානයයි. එය මාක්ස් ලෙනින්වාදය පදනම් කරගත් තරුණ සංවිධානයකි. වෙනිසියුලානු කොමියුනිස්ට් තරුණ සංගමය මඟින් නිරන්තරයෙන්ම ශිෂ්‍ය, ගොවි හා කම්කරු තාරුණ්‍යයන් ඉලක්ක කරගනිමින් සංස්කෘතික හා ක්‍රීඩා අංශවල විවිධ වැඩසටහන් සංවිධානය කර ඒ තුළින් තාරුණ්‍යය අතර තම සංවිධානය ප්‍රචලිත කිරීම සිදුකරයි. එසේම එය අයිතීන් දිනාගැනීම උදෙසා සංවිධානය වීමේදී මෙන්ම විප්ලවීය ගැඹුරක් සහිත අධ්‍යාපනය ලබාදීමේදී ද වැදගත් දේශපාලන උපක්‍රමයක් වශයෙන් භාවිතා කරයි.

## ජාතික විමුක්තිය හා සමාජවාදය උදෙසා වන අරගලය

වෙනිසියුලාවේ වැඩකරන ජනතාවට මෙන්ම තරුණ ප්‍රජාවටද තම අයිතීන් කෙරෙහි තර්ජන පමුණුවන අංශ දෙකකට එරෙහිව විරෝධය පළ කිරීමට සිදුවී තිබේ. එනම් තම අයිතීන්ට තර්ජන පමුණුවමින් වර්ධනය වන අධිරාජ්‍යවාදී බලවේගයන්ට හා වසර 18ක් පුරා අත්පත් කරගත් සමාජ පරිවර්තනයන්ට තර්ජන පමුණුවන ධනවාදී මොඩලයේ අර්බුදයන්ට එරෙහිවය.

2015න් පසු වෙනිසියුලාව ජාත්‍යන්තර වශයෙන් හුදෙකලා කිරීමට උත්සහ කිරීම හා සම්බාධක යෙදීම උග්‍ර විය. එයින් එරට ජනතාවගේ ජීවන තත්ත්වය ද ඉතා දුෂ්කර අඩියකට ඇදදැමීය. ඒ හැරුණුකොට යුරෝපා සංගමය හා ඇමරිකානු රජය මඟින් ඉතා ආසන්න කාලයේ දී පනවන ලද මෙම සම්බාධක හරහා වෙනිසියුලාව තුළ ගැටුම් ඇති කිරීමටද වෙනිසියුලාව වෙත කෙරෙන අතපෙවීම් හා මැදිහත්වීම් උග්‍ර කිරීමද වෙනිසියුලානු ජනතාවගේ ස්වයංතීරණ අයිතියට බාධා කිරීමද කලාපය තුළ ධනේෂ්වර ඒකාධිකාරය වර්ධනය කරවීම ද අරමුණු කොටගෙන ඇත. සැබවින්ම මනුෂත්වයට එරෙහි පොදු සතුරන් වන අධිරාජ්‍යවාදීන්ගේ තර්ජනවලට එරෙහිව මුහුණ දීමේ දී වෙනිසියුලාවට තම රටේ සැබෑ දේශප්‍රේමී බලවේගවල ශක්තිමත් සබඳතාවය ඉතා වැදගත් වී ඇත.

කෙසේ නමුත්, අධිරාජ්‍යවාදයට එරෙහි අරගලය අරුත් සම්පන්න වන්නේ වැඩකරන ජනතාවගේ ද තාරුණ්‍යයේ ද සුභසාධනය උදෙසා, රටේ පවතින අර්බුදයෙන් මිදීමට විප්ලවකාරී දිශානතියකින් යුත් වැඩපිළිවෙළක් අනුව කටයුතු කිරීමෙන් පමණි. වර්තමානයේ දී වෙනිසියුලාවේ තරුණ පරපුර ධනේෂ්වර අර්බුදයේ බරින් විශාල ලෙස පීඩාවට පත්ව සිටී. එසේම ධනේෂ්වර ඒකාධිකාරීන් හා මාෆියාකරුවන් විසින් මෙම අර්බුදය තවදුරටත් උග්‍ර කරමින් ද පවතී.

සමාජවාදය උදෙසා වන අරගලය, වෙනිසියුලාවේ ජනතාව තුළ මෙන්ම තරුණ පරපුර තුළ ද ඉතා ඉක්මනින් වර්ධනය කරගත යුත්තේ ධනේෂ්වර හා අධිරාජ්‍යවාදී තර්ජනවලට වඩාත් හොඳින් මුහුණ දීමට නම් එය ඉතා අත්‍යවශ්‍ය වුවත් වන බැවිනි. සමාජ සාධාරණත්වයෙන් හා සෞභාග්‍යයෙන් පිරි සමාජයක් ඇතිකර ගත හැක්කේ සමාජවාදය තුළම පමණක් බව නැවත නැවතත් තහවුරු වෙමින් පවතී.

## වත්මන් වෙනිසියුලානු තරුණයා මුහුණ දෙන ප්‍රධාන ගැටලු

එහි පවතින දුෂ්කර තත්ත්වයන් හමුවේ, නිදහස් හා ගුණාත්මක අධ්‍යාපනයක් ලැබීමට ඇති ඉඩ බරපතල ලෙස ඇහිරී ඇත. වෙනිසියුලාව තුළ උද්ධමනයද පාලනයකින් තොරව ඉහළ නගිමින් පවතින අතර මේ හේතුවෙන් තරුණ පරපුරට රටින් පිට වී රැකියා කළ යුතු තත්ත්වයක්ද ඇති වී තිබේ. ඒ අනුව බුද්ධිගලනය ද ඉතා ඉහළ ගොස් ඇත.

තවද මෙම සංකීර්ණ තත්ත්වය තුළ අර්බුදයේ ප්‍රතිඵල සමනය කිරීමට වෙනිසියුලානු රජය විසින් ගන්නා පියවර ද ප්‍රමාණවත් නොවන තත්වයක් පවා දැකිය හැකිය.

තීව්‍ර පන්ති අරගලයකට මුහුණ දී සිටින වෙනිසියුලානු තාරුණ්‍යයන් විසින් අධිරාජ්‍යවාදී මැදිහත්වීම්, පැසිස්ට්වාදීන් හෝ සමගි සන්ධාන යන ප්‍රාග්ධන බලවේගවලට සේවය කරන විකල්ප පමණක් බව පැහැදිලිවම අවබෝධ කරගත යුතුය. එසේම කම්කරු ජනතාවත් තරුණ හා ශිෂ්‍ය ප්‍රජාවත් ධනේෂ්වර ක්‍රමය පරාජය කිරීම උදෙසා සිය බලවේග ඒකරාශී කරගත යුතුමය. ඒ සඳහා වෙනිසියුලානු කොමියුනිස්ට් තරුණ සංගමය විසින් අධිරාජ්‍යවාදී තර්ජන හමුවේ පවා ඔවුන්ගේ අයිතීන් රැකගැනීමේ අරගලය වෙත සාමූහිකව පෙළගැසීමට එරට තරුණයින් හා ශිෂ්‍යයින් හට ආරාධනා කරනු ලබයි.

## වෙනිසියුලානු කොමියුනිස්ට් තරුණ සංගමය වත්මන් ගැටලුවලට මුහුණ දෙන ආකාරය

වෙනිසියුලාව තුළ පවතින තත්ත්වය හමුවේ කොමියුනිස්ට් තරුණ සංගමය ලෙස ඔවුන් වෙත විශාල වගකීමක් පැවරී තිබේ. අධිරාජ්‍යවාදයට එරෙහිව අරගල කිරීමටත්, ධනේෂ්වර ක්‍රමය පරාජය කිරීමටත්, තරුණයින් වෙත අධ්‍යාපනය ලබා දී ඔවුන්ව සංවිධානය කිරීමත් ප්‍රධානකොටම පැවරී ඇති වගකීමයි. මේ වෙනුවෙන් ඔවුන්ගේ මධ්‍යම කමිටුව විසින් තරුණ අයිතීන් වෙනුවෙන් අරගල කිරීමේ ජාතික කඳවුරු සංවිධානය කිරීම ආදිය සිදුකරමින් සිටී. ඒ හැරුණු විට බහුජන සංවිධාන ගොඩනැගීම පවා දේශපාලන ප්‍රචාරණයක් වශයෙන් භාවිතා කරයි. ඒ අනුව ශිෂ්‍යයින් සංවිධානය කරමින් ගුණාත්මක පොදු අධ්‍යාපන ක්‍රමයක් ඇතිකර ගැනීමටත් අධ්‍යාපනය වාණිජකරණය වීම වැළැක්වීමටත් අරගල කරයි. එසේම ප්‍රජා මට්ටමින් ගුණාත්මක පොදු සේවා වෙනුවෙන් මෙන්ම වැඩකරන ජනතාවගේ ශ්‍රමය සූරාකෑම, රැකියා අනාරක්ෂිතභාවයට එරෙහිව ද සංවිධානගත වෙමින් අරගල කරමින් සිටී.

## ජාත්‍යන්තර වශයෙන් ක්‍රියාකාරීත්වය

මෙකී සියලු අභියෝගයන් මධ්‍යයේ පවා ජාත්‍යන්තර වශයෙන් කටයුතු කිරීමේ දී වෙනිසියුලානු කොමියුනිස්ට් තරුණ සංගමයේ ප්‍රධානතම අරමුණ වන්නේ අධිරාජ්‍යවාදය හේතුවෙන් පීඩාවට පත්ව ලොව පුරා වෙසෙන ජනතාවට සහයෝගීතාව පළකිරීමයි. එසේම ඔවුන් සමඟ සබඳතා වර්ධනය කරගැනීමයි. එපමණකුදු නොව ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනය හා සමඟ ද ක්‍රියාකාරී ලෙස සම්බන්ධ වන ඔවුන් ඒ තුළින් පවා අධිරාජ්‍යවාදයට එරෙහිව ශක්තිමත්ව මුහුණ දීමට අවශ්‍ය ධෛර්යය ලබා ගනී.

# දිගම වාණිජ ගුවන් සැරිය




සැතපුම් 9500 ක දුර ප්‍රමාණයක් ආවරණය කරමින් ලෝකයේ දිගම වාණිජ ගුවන් ගමන ආරම්භ කිරීමට සිංගප්පූරු ගුවන් සේවය සැරසෙයි. ඒ සිංගප්පූරුවේ සිට ඇමරිකා එක්සත් ජනපදයේ නිව්යෝක් නගරය දක්වායි. මේ සඳහා ගතවන කාලය පැය 18 යි විනාඩි 45 ක් බව ගණන් බලා ඇත. මේ සඳහා Airbus A350-900URL මාදිලියේ Ultra දුරදිග ගුවන් යානයක් භාවිතයට නියමිතය. එය වඩාත් හොඳ ඉන්ධන කාර්යක්ෂමතාවයකින් යුක්ත බව ද පැවසේ.

# එක්සත් ජනපද හමුදා විසින් සිවිල් වැසියන් ඝාතනය කෙරේ



පෙන්ටගනය විසින් ඇ.එ.ජ. කොංග්‍රස් මණ්ඩලයට වාර්තා කර තිබෙන අන්දමට ඇ.එක්සත් ජනපද හමුදාව විසින් 2017 වසරේදී ලොව පුරා සිදුකරන ලද මෙහෙයුම් මඟින් සිවිල් වැසියන් 500 දෙනෙකු පමණ ඝාතනයට ලක්ව ඇත. මෙම වාර්තා සම්පූර්ණයෙන්ම විශ්වාසනීය දත්ත මත පදනම් වී ඇති බව වාර්තා වේ. මෙහි සුවිශේෂීත්වය වන්නේ මෙම මරණ සිරියාව, යේමනය, ඇෆ්ගනිස්ථානය යන රටවලදී සිදුව තිබීමත් සෝමාලියාව සහ ලිබියාවේ දත්ත මේ සඳහා ඇතුළත් නොවීමත්ය.

මේ අතර මෙම වාර්තාවලට අනුව ඇමරිකා එක්සත් ජනපදයේ වර්තමාන ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් පාලනය විසින් පසුගිය 2017 වසර තුළදී ඉරාකය, සිරියාව සහ ඇෆ්ගනිස්ථානය වෙත එල්ල කෙරුණු ගුවන් ප්‍රහාරවල ඉහළ යාමක් ද පෙන්නුම් කර ඇත.

# IMF වෙත ජෝර්දාන් ජනතාවගේ විරෝධය



ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අනුදැනුම සහිතව ජෝර්දාන් රජය විසින් භාණ්ඩ මිල ඉහළ දැමීමට සහ ආදායම් බදු අයකර ගැනීමට ගෙන ඇති තීරණයට එරෙහිව විරෝධය පාමින් ජෝර්දාන් ජනතාව සිය උද්ඝෝෂණ ආරම්භ කර ඇත. මේ සඳහා එරට වෘත්තීය සමිති, රාජ්‍ය සහ පෞද්ගලික අංශ සේවකයින් ඇතුළු දස දහස් ගණනක පිරිසක් එකතු වී ඇති බව පැවසේ.

එරට පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති මෙම නව බදු පනත හරහා තම ජීවන තත්ත්වයන් වඩාත් දරුණු කෙරෙන බවට එරට ජනතාව චෝදනා කරයි. එබැවින් එකී නව බදු පනත වහා ඉවත් කළ යුතු බවට ඔවුහු රට ආණ්ඩුවට බලකර සිටී.

# මහතීර් මොහොමඩ් යළි බලයට



පසුගිය දා පැවැත්වූ මැලේසියානු මහමැතිවරණයෙන් එරට හිටපු අගමැති නජීබ් රසාක් පරාජයට පත්කරමින් හිටපු අගමැතිවරයෙකු වූ මහතීර් මොහොමඩ් යළි අගමැති ධූරයට පත්විය. 92 හැවිරිදි මහතීර් මැලේසියාවේ වයස්ගතම අගමැතිවරයා වූ අතර ලෝකයේ තේරී පත්වූ වයස්ගතම නායකයා ද විය. කෙසේවෙතත් හිටපු අගමැති නජීඩ් මහතාට පසුගිය කාල සීමාවේ දී එල්ල වූ මූල්‍ය වංචා පිළිබඳ චෝදනා ද ඔහුගේ පරාජයට හේතු විය. මහතීර් මොහොමඩ්ගේ ගෝලයෙකු වූ නජීබ් සිය ගුරුවරයා ඉදිරියේ පරාජයට පත්ව ඇත. 1981 සිට 2003 දක්වා වූ සිය පාලන කාලය තුළ මැලේසියාව ආර්ථිකමය අතින් වඩාත් ශක්තිමත් කළ නායකයෙක් ලෙස මහතීර් මොහොමඩ්ව සැලකේ.

දැනුම

විශ්වයේ බිහිවීම - 08 කොටස

**පසුගිය forward කලාපය තුළින් අප සාකච්ඡාවට ලක් කළේ සෞරග්‍රහ මණ්ඩලය ගැනයි. එහිදී අප සෞරග්‍රහ මණ්ඩලය කියන්නේ මොකක්ද යන්න ගැනත් සෞරග්‍රහ මණ්ඩලයේ අධිපතියා වූ සූර්යයා ගැනත් හඳුනාගැනීමක් සිදුකළා. මෙවර කලාපයෙන් අප සාකච්ඡාවට බඳුන් කරනුයේ සෙසු ග්‍රහයින් පිළිබඳවය.**



# පෘථිවියේ ළඟම නෑයින් හඳුනාගනිමු

## බුධ

ග්‍රීකයින් විසින් මීට අවුරුදු 5,000කට පෙර සුමේරියන් යුගයේදී බුධ ග්‍රහයා හඳුනා ගනී. මෙහි විෂ්කම්භය කි.මී. 4,878 කි. සූර්යයා ආසන්නයේම පිහිටා ඇති ග්‍රහලෝකය බුධ වේ. මෙහි විශාලත්වය පෘථිවියෙන් 40%ක් වන අතර චන්ද්‍රයාට වඩා 40%ක් පමණ විශාලය. බුධ ග්‍රහයා තම අක්ෂය වටා කරකැවීම ඉතාම සෙමින් සිදුවන්නකි. බුධ ග්‍රහයාට දවල් සහ රාත්‍රිය ගතවීමට දින 59 ක් ගත වේ. නිරන්තරයෙන් අධික උෂ්ණත්වයකින් හෙබි ගල්, පර්වත, කඳුවලින් ගහන වූ බුධ ග්‍රහයා තුළ වායුගෝලයක් හෝ ජලය හෝ නොමැත. එබැවින් ජීවීන් ද නැත. එය යකඩ, නිකල්, සිලිකේට්වලින් සෑදී ඇත. සූර්යයාට ආසන්නයේම පිහිටා ඇති බැවින් මෙහි උෂ්ණත්වය වැඩිය. එය දිවා කාලයේ දී කෙල්වින් 673ක් වන අතර රාත්‍රී කාලයේ දී කෙල්වින් 175කි. බුධ ග්‍රහයා මතුපිට චුම්භක ක්ෂේත්‍රය පෘථිවිය මෙන් 1% කි. එයට හේතුව වන්නේ බුධ ග්‍රහයාගේ අභ්‍යන්තර මධ්‍යය ද්‍රව යකඩවලින් සමන්විත වීමයි. පෘථිවියේ සිට ඊට දුර සැතපුම් මිලියන 57කි. බුධ ග්‍රහයා සූර්යයා වටා ගමන් කරනුයේ ඉලිප්සාකාර කක්ෂයකය. බුධට තමා වටා භ්‍රමණය වීමට පෘථිවි දින 59 ක් ගත වන අතර සූර්යයා වටා එක් වරක් භ්‍රමණය වීමට දින 89 ක් ගත වේ.

## සිකුරු

සෞරග්‍රහ මණ්ඩලයේ අලංකාරවත්ම ග්‍රහලෝකය සිකුරු වේ. සමහර දිනවල ඉර බැස යාමෙන් පසුවද සමහර දිනවල පාන්දර ද මෙම ග්‍රහලෝකය දැකගත හැකිය. එබැවින් මෙය ''පහන් තරුව'', ''ඉරබටු තරුව'' හා ''උදාන තරුව'' ලෙසින්ද හඳුන්වයි. මෙහි විෂ්කම්භය කි.මී. 12,104 කි. එය පෘථිවියේ විෂ්කම්භයෙන් 95% කි. එසේම සිකුරු ග්‍රහයා පෘථිවියේ බරින් 82% වේ. එය පෘථිවියට ඉතා ළඟින්ම පිහිටි ග්‍රහයා ද වෙයි. සූර්යයා වටා ගමන් කිරීමට එයට දින 262ක කාලයක් ගත වේ. සූර්යයාගේ සිට සිකුරු ග්‍රහයාට දුර කිලෝමීටර් මිලියන 108 කි. සිකුරු ග්‍රහයා ආවරණය වී ඇත්තේ වළාකුළු, ජලවාෂ්ප හා සල්ෆියුරික් ඇසිඩ්වලිනි. එය සාමාන්‍ය දුරේක්ෂයකින් බලාගත නොහැක. බුධ වැනි ග්‍රහයින් තම අක්ෂයේ භ්‍රමණය වන්නේ බස්නාහිර සිට නැගෙනහිරට
වන නමුත් සිකුරු ග්‍රහයා නැගෙනහිර සිට බස්නාහිරට භ්‍රමණය වේ. මෙහි උෂ්ණත්වය ඉතා ඉහළය. සූර්යයා ආසන්නයේ බුධ ගමන් කළත් බුධටත් වඩා එය උණුසුම්ය. එය කෙල්වින් 750 ක් වේ. එබැවින් එහි ජලය හෝ ජීවීන් නොමැත. එම නිසා මෙය ද බුධ මෙන්ම කාන්තාර ග්‍රහයෙක් ලෙස හඳුන්වයි. එහි මතුපිට 80% ක්ම පවතින්නේ තැනිතලා බිම් ලෙසයි. වායුගෝලයේ කාබන්ඩයොක්සයිඩ් සංයුක්ත වී ඇත. එබැවින් ග්‍රහලෝකය මතුපිටට ලැබෙන සූර්ය කිරණ මඟින් එය තදින්ම උණුසුම් වී ඇති අතර එම උණුසුම වලාකුළු සහ කාබන්ඩයොක්සයිඩ් හේතුවෙන් පරාවර්තනය වීමක් සිදු නොවේ. මෙහිදී හරිතාගාර ආවරණය ද බලපානු ලැබේ. එය සිලිකේට්, යකඩ හා නිකල්වලින් සෑදී ඇත.

## පෘථිවිය

ග්‍රහලෝක අතරින් ජීවය පවතින එකම ග්‍රහලෝකය පෘථිවිය වේ. එහි විෂ්කම්භය කි.මී. 12,756 කි. එහි මතුපිටින් 2/3ක්ම පිරී ඇත්තේ ජලයෙනි. එක් චන්ද්‍රයෙක් පමණක් ඇත. පෘථිවිය තම අක්ෂය වටා සෑම පැය 24කටම වරක් බස්නාහිර සිට නැගෙනහිරට භ්‍රමණය වේ. මෙය ''පෘථිවි දිනක්'' නමින් හැඳින්වේ. පෘථිවියට සූර්යයා වටා යාමට දින 365.25 ක් ගත වේ. මෙම දින 0.25 වසර 4ක් පුරා එකතු කිරීම නිසා වසර 4කට පසු එළැඹෙන වසර අධි වසරක් ලෙස සැලකේ. පෘථිවිය ස්ථර කිහිපයකින් නිර්මාණය වී ඇත. එහි ඇතුළතින්ම ඇත්තේ අභ්‍යන්තර හරය වේ. ඊට පිටතින් ඇත්තේ බාහිර හරයයි ඊටත් පිටතින් පහළ ප්‍රාවරය නම් කොටසක් ඇත. ඊට පිටතින් ඉහළ ප්‍රාවරය නම් කොටසක් ඇත. පිටතින්ම ඇත්තේ පෘථිවි කබොලයි.

චන්ද්‍රයාගේ සිට පෘථිවියට දුර කි.මී. 380,000කි. මෙය පෘථිවියට ආසන්නතම ග්‍රහවස්තුව වේ. එමඟින් බල පවත්නා ආකර්ෂණ බලය නිසා පෘථිවියේ ඇති මුහුදු හා සාගරවල වඩදිය හා බාදිය ඇතිකරනු ලබයි. පෘථිවියේ උසම ස්ථානය වන්නේ එවරස්ට් කඳු මුදුන (8,850 m වන අතර එහි ගැඹුරුම ස්ථානය වන්නේ මරියානා ආගාධය (11,520 m) යි. පෘථිවිය පැයට කිලෝමීටර් 1500 ක වේගයෙන් තමා වටා භ්‍රමණය වෙමින් හිරු වටා පැයට කිලෝමීටර් 107,000 ක වේගයෙන් පරිභ්‍රමණය වේ.

## අඟහරු

සෞරග්‍රහ මණ්ඩලයේ රතු පැහැයෙන් දිස්වන එකම ග්‍රහලෝකය අඟහරුය. එබැවින් මෙය රතු ග්‍රහයා ලෙස ද හැඳින්වේ. පෘථිවියට සිකුරු හැර ළඟින්ම පිහිටා ඇති ග්‍රහලෝකය වන්නේද අඟහරුය. මෙහි විෂ්කම්භය කි.මී. 6794කි. අඟහරු ග්‍රහයාගේ සෘතු ඇති වීම් සොයාගෙන ඇති අතර ඒවායේ කාලය පෘථිවියේ සෘතුවලට වඩා දෙගුණයකි. අඟහරුට ඉතාමත් තුනී වායුගෝලයක් පවතින අතර එහි ඇත්තේ භූමිකම්පා නිසා එකතු වූ කාබන් ඩයොක්සයිඩ්ය. මෙහි රාත්‍රී කාලයේ උෂ්ණත්වය කෙල්වින් 187 වන අතර දිවා කාලයේ දී කෙල්වින් 244කි.

දැනට සෞරග්‍රහ මණ්ඩලයේ ඇති සුවිශාලම ගිනිකන්ද සොයාගෙන ඇත්තේ ද අඟහරු මතිනි. එය සොයාගෙන ඇත්තේ 1971 දී අඟහරු කරා ගිය මැරිනර් නම් අභ්‍යවකාශ යානයෙනි. අඟහරුට චන්ද්‍රයන් දෙදෙනෙකු සිටින අතර එය හඳුනාගනු ලැබුවේ ඇමරිකානු ජාතික එසාප් හෝල් විසිනි. අඟහරු ආසන්නයේම ඇති චන්ද්‍රයා ෆෝබොස් ලෙසද එයට පිටතින් ඇති චන්ද්‍රයා ඩෙයිමොස් ලෙසද නම් කර ඇත. මේ වන විට විද්‍යාඥයන් විසින් අඟහරු මත ජලය සහ ජීවීන් පවතීද යන්න පිළිබඳ පරීක්ෂණ සිදුකරමින් තිබේ.

## බෘහස්පති

සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහලෝක අතරින් විශාලම ග්‍රහලෝකය වන්නේ මෙයයි. සෙසු සමස්ත ග්‍රහලෝකවල මුළු බරෙන් 71% ක ස්කන්ධයකින් යුක්ත මෙය සියලුම ග්‍රහලෝකවල පරිමා එක් කළ විට ඒවා මෙන් 2.5ක ගුණයකින් යුක්ත වේ. බෘහස්පතිගේ විශ්කම්භය පෘථිවියේ විශ්කම්භය මෙන් 10 ගුණයකට ආසන්න වේ. එනම් වර්ග කිලෝමීටර් 142,984 කි. බෘහස්පති මත තද පැහැති පටි (belt) වැනි ප්‍රදේශ ද දීප්තිමත් ප්‍රදේශ ද දැකගත හැක. ඒවා පෘථිවියටද වඩා විශාල ව්‍යුහයන් වේ. එම පටිවල වර්ණ කොළ, රතු හෝ දුඹුරු වේ. මෙහි දක්ෂිණ ධ්‍රැවය ආසන්නයේ තද රතු පැහැ ලප දක්නට ලැබේ. ග්‍රහලෝක අතරින් අධිකම ගුරුත්වාකර්ෂණ බලයක් ඇත්තේ බෘහස්පතිටය. බෘහස්පති සතුව චන්ද්‍රයින් 16 ක් පවතී. බෘහස්පති සතුව වළලු පවතින අතර ඒවා ඉතා දුර්වල ලෙස බෘහස්පති අසල පවතී.

## සෙනසුරු

සෞරග්‍රහ මණ්ඩලයේ දර්ශනීයම ග්‍රහලෝකය ලෙස හඳුන්වන්නේ සෙනසුරුය. සෙනසුරු වටා දර්ශනීය වළලු පද්ධතියක් පිහිටා තිබීම නිසා මේ විරුදාවලිය ලබා ඇත. ගල්, පර්වත, හා අයිස්වලින් නිර්මාණය වූ වළලු තුනක් මේ වටා පවතී. එහි වර්ණ ප්‍රධාන ලෙස කළු හා දුඹුරු වේ. මේවා විවිධාකාර දුරවලින් එකම තලයක පිහිටමින් සෙනසුරු වටා භ්‍රමණය වේ. විෂ්කම්භය කිලෝමීටර් 120,660 ක් වන මෙය දෙවෙනි විශාලතම ග්‍රහයා වේ. සෙනසුරුගේ මධ්‍යයේ ඇති පාෂාණ ඝණත්වයෙන් ඉතා අඩු බැවින් මෙය ඝණත්වය අඩුම ග්‍රහයා ලෙස ද සැලකේ. මෙයට චන්ද්‍රයන් 23 ක් සිටින අතර වැඩිම චන්ද්‍රයන් හිමි ග්‍රහලෝකය ද වේ.

## යුරේනස්

මෙය 1781 දී විලියම් හර්ෂල් (william herschel) විසින් සොයාගෙන ඇත. යුරේනස් සෞරග්‍රහ මණ්ඩලයේ ඇති තුන්වන විශාලතම ග්‍රහයා වේ. මෙහි විශ්කම්භය කි.මී. 50,800 කි.

යුරේනස් වටා වර්ණ වළලු 10 ක් පවතින අතර ඒවා සෙනසුරු ගේ හා බෘහස්පතිගේ වළලුවලට වඩා පටු ය. සූර්යයා වටා යුරේනස් ගමන් කරනුයේ ද සිකුරු මෙන්ම වාමාවර්තවය. සූර්යයා වටා යාමට යුරේනස්ට පෘථිවි වසර 84 ක් ගත වේ. යුරේනස් සූර්යයා වටාගමන් කිරීමේදී ඇතිවන අසාමාන්‍ය හැසිරීම් රටාව නිසා සෘතු ඇති වේ. යුරේනස් සතුව චන්ද්‍රයින් 15ක් ද පවතී.

## නෙප්චූන්

ප්‍රංශ ජාතික ලැවේරියල් හා ඇඩම්ස් විසින් සොයාගෙන ඇත. මෙහි විෂ්කම්භය කි.මී. 48,600 කි. නිල් පැහැතිය. නෙප්චූන්හි ආරුක්කු හැඩැති වළලු දෙකක් දැකගත හැක. නමුත් සෙසු ග්‍රහලෝක වටා ඇති ඒවා වෘත්තාකාර වේ. එසේම නෙප්චූන්ගේ මෙම වළලු සෙනසුරු වටා ඇති වළලුවලට වඩා පටුය. නෙප්චූන් සතුව චන්ද්‍රයින් 8ක් පවතින අතර සෞරග්‍රහ මණ්ඩලයේ චන්ද්‍රයන්ගෙන් විශාලතම චන්ද්‍රයෙක් වන ටයිටන් ද එය සතුයි.

මීලඟ forward කලාපයෙන් අප සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන්නේ සෞරග්‍රහ මණ්ඩලයේ වාමනයින් පිළිබඳවයි.



# පසුගාමීත්වය

අප සමාජයේ අදහස් හුවමාරු කරගැනීමේ දී නිතර අසන්නට ලැබෙන ප්‍රශ්නයක් තමයි "පසුගාමීත්වය" කියන්නේ. "ලංකාවේ මිනිස්සු හරිම පසුගාමී" අය, "කාන්තාවන් පසුගාමී විදිහටමයි හිතන්නේ", "ලෝකයේ දියුණු රටවලට සාපේක්ෂව ලංකාවේ කම්කරුවෝ, ගොවියෝ හරිම පසුගාමීයි." වැනි දේ නිතරම ඇහෙනවා. ඒ වගේම පසුගිය දවස්වල ජාතිවාදී ගැටුම් ඇතිවීමේදීත් බොහෝ අය කියන්න ගත්තා "ජාතිවාදීන් පසුගාමීයි" කියලා. මේ නිසාම පසුගාමී යන වචනය දේශපාලනිකව හඳුනාගත යුතු වෙනවා.

පසුගාමී යන පදයේ විරුද්ධ පදය වන්නේ පෙරගාමී (ඉදිරිගාමී) යන්නයි. මේ අනුව පැහැදිලි වනුයේ පසුගාමී හෝ පෙරගාමී ලෙස යමක් අර්ථවත් කරනුයේ සාපේක්ෂකව බවයි. දැන් අප අධ්‍යයනය කළ යුතු වන්නේ එය සාපේක්ෂ වන්නේ කුමකටද යන්නයි. එහි දී එය අප සියුම්ව තේරුම් ගතයුතු වෙනවා. සමාජය ඉදිරියට ගමන් කරමින් තිබෙනවා. ප්‍රාථමික සාමූහික සමාජයේ සිට අප විවිධ අවධි පසු කරමින් පැමිණ තිබෙනවා. විවිධ සංවර්ධන අවධි පසුකර තිබෙනවා. මෙම ක්‍රියාවලිය අප පොදුවේ හඳුන්වනු ලබන්නේ සමාජ සංවර්ධනය ලෙසයි. මිනිස් සමාජයේ මූලික ප්‍රතිවිරෝධතාවය තිබෙන්නේ

- නිෂ්පාදන බලවේග හා
- නිෂ්පාදන සබඳතා අතරයි.

මෙම දෙපාර්ශවුයේ ගැටුමෙන් සමාජය ඉදිරියට ගමන් කරනු ලබනවා. මෙම ගැටුමේ ප්‍රතිඵලයක් ලෙස සමාජයේ ප්‍රමාණාත්මක මෙන්ම ගුණාත්මක පරිවර්තනයන් දැකගත හැකි වෙනවා.

මෙහිදී නිෂ්පාදන බලවේග ලෙස හඳුන්වනු ලබන්නේ නිෂ්පාදන කාර්යය සඳහා දායකත්වය සපයන ජනතාවයි. නැතිනම් ශ්‍රමිකයායි (කම්කරුවා). නිෂ්පාදන සබඳතා ලෙස හඳුන්වනු ලබන්නේ ශ්‍රමිකයා විසින් නිෂ්පාදනය කරනු ලබන දේහි අයිතිකාරීත්වය හිමිකරගනු ලැබීමයි. මෙම පාර්ශව දෙකෙහි අනවරත ගැටුමෙන් පැරණි සමාජය අභාවයට යවමින් නව සමාජයක් බිහිකරනු ලබයි. මෙහිදී නිෂ්පාදන බලවේගයන්ගේ වර්ධනයට සාපේක්ෂව එම සමාජයේ මිනිස් සම්බන්ධතා හා බලවේගවල මට්ටම තීරණය වේ. නමුත් ලෝකයේ එකවිට හැමතැනම එක සමානව සංවර්ධනයක් සිදු නොවේ. එක් තැනක දියුණු සංවර්ධනයකුත් තවත් තැනක නොදියුණු සංවර්ධනයකුත් සිදුවේ. එයට භූගෝලීය ස්වභාවය වැනි විවිධ සාධක බලපානු ලබයි. වර්තමානය ගැන සැලකිලිමත් වීමේදී පැහැදිලි වනුයේ ඇතැම් රටල් දියුණු මට්ටමේ පවතින අතර තවත් රටවල් තුළ ගෝත්‍රික මට්ටමේ ලක්ෂණ පවා දැකගත හැකිවීමයි. ඒවා සංවර්ධනය වනුයේ ඉතාමත් සෙමිනි. ඉදිරියට යන රටවලට සාපේක්ෂව බොහෝ පිටුපසින් ගමන් කරන රටවල් හා එහි ජනතාව හඳුන්වනු ලබන්නේ "පසුගාමී" ලෙසයි.

ඒ අනුව ඔබට පැහැදිලි වනු ඇති, සමාජ සංවර්ධනයේදී ද දියුණු නොවී, වර්ධනය නොවී හෙමින් වර්ධනය වන නැතහොත් පිටුපසින් ගමන් කරන දේ "පසුගාමීත්වය" ලෙස හඳුන්වනු ලබන බව.

යම් රටක නිෂ්පාදන බලවේග සංවර්ධනය නොවී අනෙක් රටවලට සාපේක්ෂව පසුපසින් ගමන් කරයි නම් එම රටවල ජනතාවගේ ද්‍රව්‍යමය ජීවිතය දුර්වල වෙනවා නොඅනුමානයි. ඒ මත ගොඩනැගෙන මානසිකත්වය, සමාජ විග්‍රහය පසුගාමී වීම වළක්වාලිය නොහැකියි.

සමහර රටවල් පසුගාමීව ගමන් කිරීම සමාජ සංවර්ධනයට බාධාවක් වෙනවා. ධනවාදය තුළ පවා දියුණු හා පසුගාමී රටවල් ලෙස පැවතීම තුළින් ධනවාදයේ අසමතුලිතතාවය හා අසමාන සංවර්ධන සූරාකෑම පැහැදිලි වනු ඇති. පසුගාමීත්වය පරාජය කළ හැකිවන්නේ නිෂ්පාදන බලවේගයන්ගේ සංවර්ධනයට බාධා එල්ල වන බලවේග පරාජය කිරීමෙනි. නිෂ්පාදන බලවේගයන්ට ධනවාදය තුළ බාධා එල්ල කරනුයේ නිෂ්පාදන සබඳතා විසිනි. එම බාධා පරාජය කළ හැකි වනුයේ සමාජවාදී ක්‍රමයකදීය. මේ අනුව පැහැදිලි වනුයේ පසුගාමීත්වය යනු සමාජ සංවර්ධන ක්‍රියාවලිය තුළ ඊට සාපේක්ෂව තේරුම්ගත යුතු දෙයක් බවයි.

## පළමු සෙල්ෆිය

"සෙල්ෆි - selfie " ගැනීම අද වෙනකොට "උන්මාදයක්" බවට පත්වෙලා. ඉතින් මේ තියෙන්නේ ලෝකයේ පළමු සෙල්ෆි ඡායාරූපයයි කිව්වොත් ඔබ පුදුම වේවි. ඇමරිකානු ජාතික ඡායාරූප ශිල්පී රොබට් කෝර්නේලියස් කියන පුද්ගලයා තමයි මේ ඉන්නේ. අදින් වසර 179 කට පෙරාතුව 1839 දී ගත්ත මේ සෙල්ෆිය ලබාගැනීම කෝර්නේලියස්ට පහසු වෙලා නැහැ. ඔහු කැමරාව ක්‍රියාත්මක කරලා එය ඉදිරියට දිව ගිහින් විනාඩියකට වඩා බලාගෙන ඉඳලා තියෙනවා කියලයි කියන්නේ. මොකද අද අපිට වගේ smart phone ඒ කාලේ තිබුණේ නැති නිසා.

කොහොම නමුත් "සෙල්ෆි" ලොව පුරා ජනප්‍රිය වන්නට පටන් ගත්තේ මීට වසර 15කට පමණ ඉහතදී වුනත් මෙම ඡායාරූප කලාවට "selfie" යන නම භාවිතා වන්නට පටන් ගෙන ඇත්තේ වර්ෂ 2002 දී කියලයි කියන්නේ. ඒ ඕස්ට්‍රේලියානු ජාතික තරුණයෙක් විසින් තමන් මුහුණ පෑ අනතුරක් සම්බන්ධයෙන් සමාජ මාධ්‍යයක් තුළ ඡායාරූපයක් පළකිරීමෙන් අනතුරුවයි. මැහුම් දමන ලද තම දෙතොලෙහි ඡායාරූපයක් පළකරමින් "ඡායාරූපය අපහැදිලි වන්නේ එය "සෙල්ෆියක්" නිසා " බවට සටහනක් යොදා ඒ ගැන ඔහු සමාව ඉල්ලා තිබුණා.

ඉතින් ඔන්න ඕකයි "සෙල්ෆියේ" කථාව.



ශ්‍රී ලංකාවේ දේශපාලනය ධනපති පංතියේ මැති ඇමති දූ පුතුන්ගේ අත දෝලනය වන අවදියක 2018 පෙබරවාරි 10 වන දින පැවති පළාත් පාලන මැතිවරණය සඳහා ජවිපෙ නියෝජනය කරමින් සමාජවාදී තරුණ සංගමයේ සාමාජික සහෝදර සහෝදරියන් විශාල ප්‍රමාණයක් අපේක්ෂකයන් ලෙස ඉදිරිපත් වීම විශේෂ කරුණකි.

එහිදී ලබාගත් මන්ත්‍රී ධුරවලින් සැලකිය යුතු ප්‍රමාණයක් සඳහා තරුණ සංගමයේ සාමාජිකයින් පත්කිරීම නවමු මෙන්ම වටිනා අත්දැකීමකි. ඉදිරි මෙවර පළාත් පාලන ආයතන සඳහා තේරී පත්වූ තරුණ මන්ත්‍රීවරුන්ගේ කාර්යභාරය හා සමාජවාදී තරුණ සංගමයේ මන්ත්‍රීවරයෙකු අනෙකාගෙන් වෙනස් වන්නේ කෙසේද යන්න පිළිබඳව ඔවුන් දැක්වූ අදහස් කිහිපයක් මෙසේ සටහන් කරමු...

## "තරුණ තරුණියන්ව නව සමාජ පරිවර්තනයක් කරා රැගෙන යනවා"



සමාජවාදී තරුණ සංගමයේ නුවරඑළිය ආසන සංවිධායක
**ටී. මනී සහෝදරයා**
### නුවරඑළිය ප්‍රාදේශීය සභාව

නුවරඑළිය ප්‍රාදේශීය සභාව කියන්නේ දූෂණ, වංචා සහ මූල්‍ය අක්‍රමිකතා රාශියක් සමඟ පවත්වාගෙන ගිය ප්‍රාදේශීය සභාවක්. නමුත් ඊට විරුද්ධව අපට කළ හැකි උපරිම මැදිහත්වීම සිදුකිරීමට බලාපොරොත්තු වෙනවා. ඒ වගේම ප්‍රාදේශීය සභාව තුළින් ජනතාවට ඉටුවිය යුතු සියලු මූලික අවශ්‍යතාවයන් නොපිරිහෙළා ඉටු කිරීමටත්, ප්‍රාදේශීය සභාව තුළ ජීවත් වෙන තරුණ තරුණියන් මුහුණ දෙන ගැටලුවලට විසඳුම් සෙවීමටත්, ඔවුන්ව නව සමාජ පරිවර්තනයක් කරා රැගෙන යාමටත් බලාපොරොත්තු වෙනවා.

## "තාරුණ්‍යය වෙනුවෙන් හඬක් නගනවා"



සමාජවාදී තරුණ සංගමයේ ජාඇල ආසනයේ සංවිධායිකා
**පී. සචිනි නිමේෂා සහෝදරිය**
### ජාඇල ප්‍රාදේශීය සභාව

වර්තමාන තරුණ පරම්පරාව විවිධ ගැටලුවලට මුහුණ දෙමින් සිටින අවධියක තාරුණ්‍යය වෙනුවෙන් වගේම ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ද සේවයක් කිරීමට අවස්ථාවක් ලැබීම සතුටක්. මම දැනට ප්‍රාදේශීය සභාවේ ක්‍රීඩා, තරුණ කටයුතු හා මත්ද්‍රව්‍ය නිවාරණ කමිටුවේ සමාජිකාවක් ලෙසත් කටයුතු කරනවා. මේ හරහා වර්තමාන තරුණයාව ගිලගනිමින් තිබෙන මත්ද්‍රව්‍ය උවදුර මැඩලීම සඳහා උපරිම මැදිහත් වීමක් සිදුකිරීමට බලාපොරොත්තු වෙනවා. ඒ වගේම ප්‍රදේශයේ විශාල අඩුවක්ව පවතින පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමටත් දරුවන්ගේ අධ්‍යාපනය ඉහළ නැංවීම සඳහා ප්‍රාදේශීය සභාව හරහා ලබාදිය යුතු පහසුකම් ලබා දීමටත් බලාපොරොත්තු වෙනවා. තවද වැඩිවශයෙන්ම අද සමාජයේ පීඩාවට පත් වී ඇති කාන්තාව වෙනුවෙන්, ඔවුන්ගේ ගැටලුවලට විසඳුම් ලබාගැනීමට අවශ්‍ය සහයෝගය ලබා දීමටත්, ජනතා විමුක්ති පෙරමුණේ සහ සමාජවාදී තරුණ සංගමයේ සාමාජිකාවක් ලෙස ජනතාව වෙනුවෙන් හඬක් නැගීමටත් කටයුතු කරනවා.

## "දෙහිඕවිට ජනතාව වෙනුවෙන් කැප වෙනවා"



සමාජවාදී තරුණ සංගමයේ දෙහිඕවිට ආසනයේ සංවිධායක
**කෝසල නුවන් ජයවීර සහෝදරයා**
### දෙහිඕවිට ප්‍රාදේශීය සභාව

කෑගල්ල දිස්ත්‍රික්කයේ දෙහිඕවිට ප්‍රාදේශීය සභාව කියන්නේ බොහොම සුන්දර ප්‍රදේශයක්. අපේ ජනතාවගේ ප්‍රධාන ජීවන වෘත්තිය වන්නේ රබර්, තේ සහ පතල් කර්මාන්තයයි. ඒත් පැවති පාලනයන්ගේ අඩුපාඩු නිසා ජනතාවගෙන් බහුතරයක්ම තමන්ගෙ කෑම වේල් දෙකක් පිරිමහ ගන්නෙත් බොහොම අමාරුවෙන්. ඒ නිසා එම ජනතාවගේ ප්‍රශ්නවලට විසඳුම් ලබා දීමටත්, විශේෂයෙන්ම කැළි කසළ නිසි අයුරින් බැහැර නොකිරීම, පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන නොමැති වීම වැනි බොහෝමයක් අඩුපාඩු වලට නිසි විසඳුම් ලබා දීමටත් අවශ්‍ය මැදිහත්වීම කිරීමට බලාපොරොත්තු වෙනවා. ඒ වගේම ජනතා විමුක්ති පෙරමුණේ තරුණ ජනතා නියෝජිතවරයෙක් වශයෙන් ප්‍රධාන වශයෙන් ජනතාවගේ ජීවිත නගාසිටුවීමට අවශ්‍ය නව දේශපාලන පරිවර්තනයක් වෙනුවෙන් ප්‍රදේශයේ තරුණ, ශිෂ්‍ය, කාන්තා ආදී සියලු බලවේග වැඩ කිරීමටත් බලාපොරොත්තු වෙනවා.

## "සැබෑ මහජන නියෝජිතවරියක් ලෙස කටයුතු කිරීමට මේක හොඳ අවස්ථාවක්"



සමාජවාදී තරුණ සංගමයේ කොළඹ දිස්ත්‍රික් බලමණ්ඩලයේ කාරකසභික
**සිත්ති නබිලා හම්සා සහෝදරිය**
### කොළඹ මහ නගර සභාව

ඡන්දය ලබා ගැනීම සඳහා පමණක්ම දේශපාලකයින් විසින් ජනතාව සොයාගෙන යන යුගයක සැබෑ මහජන නියෝජිතවරියක් ලෙස ජනතාව අතරට ගොස් ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට මේක හොඳ අවස්ථාවක්. වර්තමානය වන විට කොළඹ මහ නගර සභා බලප්‍රදේශයට බලපාන විශාලතම සහ ප්‍රධානතම ගැටලුව වන්නේ මත්ද්‍රව්‍ය උවදුරයි. පැවති පාලන අධිකාරීන් විසින් මේ ව්‍යසනයෙන් රටේ තාරුණ්‍යය මුදාගැනීම වෙනුවට සිදු කළේ තව තවත් ඔවුන්ව ඒ තුළටම ඇද දැමීමයි. අපිට තියෙන ලොකුම අභියෝගය තමයි තරුණයා අතරට ගිහින් මේ තත්වය ඔවුන්ට තේරුම් කර දීම සහ ඊට විසඳුම් ලබා ගැනීම සඳහා ක්‍රියාත්මක වීම. දැනටමත් අපි සමාජවාදී තරුණ සංගමය ලෙස නගර සභා බලප්‍රදේශයේ ගම්මානවල තරුණ තරුණියන් සහභාගී කරවා ගනිමින් ක්‍රීඩා සමිති හා තරුණ සමිති ගොඩනගමින් තිබෙනවා. ඒවා හරහා තාරුණ්‍යය දැනුවත් කරමින් ඉන්නවා. ඒ වගේම තමයි බොහෝම වේගයෙන් ව්‍යාප්ත වන ජාතිවාදය නවත්වා, කුඩාම පාලන ඒකකයේ සිට මුළු රට පුරාම ජාතික සමගිය ඇති කිරීමට අවශ්‍ය සහයෝගය සහ ශක්තිය එකතු කිරීමට බලාපොරොත්තු වෙනවා.

## "ඩෙංගු වසංගතයට, විෂමත් උවදුරට එරෙහිව ක්‍රියා කරනවා"



සමාජවාදී තරුණ සංගමයේ කැකිරාව ආසන බලමණ්ඩලයේ ලේකම්
**සඩාච්චරම් ජෙගදීසන් සහෝදරයා**
### කැකිරාව ප්‍රාදේශීය සභාව

මෙතෙක් විවිධ අක්‍රමිකතා සහිතව පවත්වාගෙන ආ කැකිරාව ප්‍රාදේශීය සභාව තුළ දූෂණ, වංචා නවතා මහජනතාවට උපරිම සේවයක් සැපයීමට බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම කැකිරාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ තරුණයින් බෙහෙවින්ම විෂ මත්ද්‍රව්‍යයට ඇබ්බැහි වී ඇති නිසා මේ ව්‍යසනයෙන් අපේ තරුණ පරම්පරාව මුදා ගැනීම සඳහා වූ උපරිම මැදිහත්වීම සිදුකිරීමට බලාපොරොත්තු වෙනවා. ඒ වගේම වේගයෙන් ව්‍යාප්ත වන ඩෙංගු වසංගතයෙන් ප්‍රදේශයේ ජනතාව මුදා ගැනීමටත්, විශාල ලෙස අපිරිසිදුව පවතින කැකිරාව නගරය සහ අවට ප්‍රදේශය ජනතාවට ජීවත් වීමට සුදුසු පරිසරයක් බවට පත් කිරීමටත් බලාපොරොත්තු වෙනවා.






# ජාතික සමගිය වෙනුවෙන් ඉෆ්තාර් සමරුම්

"එක රටක් - මනු පවුරක්" තේමාව යටතේ ජාතික සමගිය ගොඩනැගීමේ අරමුණ ඇතිව රට පුරා ඉෆ්තාර් සැමරුම් සංවිධානය කොට තිබේ. ඒ සමාජවාදී තරුණ සංගමය සහ ප්‍රගතිශීලී සංවිධාන රැසකගේ එකමුතුවෙනි. එහි ජාතික උත්සවය පසුගිය ජූනි 10 දින කොළඹ, මාළිගාවත්ත ඉස්ලාම් මධ්‍යස්ථානයේදී පැවැත්විණි. ඊට ආගමික නායකයින්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, කලාකරුවන්, ප්‍රදේශයේ පොලිස් නිලධාරීන්, රාජ්‍ය නිලධාරීන් මෙන්ම ප්‍රගතිශීලී සංවිධාන නියෝජිතයින් හා දේශපාලන නියෝජිතයින් රැසක්ද සහභාගී වූහ.

එහිදී ශ්‍රී ලංකා මුස්ලිම් කවුන්සිලය නියෝජනය කරමින් එන්. එම්. අමීන් මහතා, ජාතික භික්ෂු පෙරමුණේ විධායක සභික මීගහජදුරේ ශීලානන්ද හිමි, කොළඹ නීති විද්‍යාලයේ කථිකාචාර්ය නොයෙල් ඩයස් පියතුමා, සිත්ති විනායගර් කෝවිලේ නීතිරාජ කුරුක්කල්තුමා, විශ්වවිද්‍යාල ආචාර්යවරුන් නියෝජනය කරමින් ආචාර්නී හරිනි අමරසූරිය මහත්මිය, කලාකරුවන් නියෝජනය කරමින් සුනිල් පෙරේරා මහතා, සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා සහ කෝප් කමිටු සභාපති සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා ඇතුළු පිරිසක් අදහස් දැක්වූහ.


කොළඹ




මැදවච්චිය


මාතලේ



නුවර



හම්බන්තොට


ගාල්ල



## "එක රටක් - මනු පවුරක්" වෙනුවෙන් සංවිධාන රැසක් එක් වේ



"එක රටක් - මනු පවුරක්" යන මැයෙන් පැවැත්වූ මාධ්‍ය සාකච්ඡාවක් පසුගිය ජූනි 05 දින මරදාන CSR හිදී පැවැත්විණි. එහිදී ලංකාවේ ජාතික සමගිය ගොඩනැගීම වෙනුවෙන් වන ද්වීමාසික වැඩසටහනක් ඉදිරිපත් කෙරුණි. ඒ අනුව සිංහල, දෙමළ හා මුස්ලිම් ජාතිකත්වයන් එකට ජීවත් වන ගම්මානවල ජාතික සමගි වැඩසටහන් පැවැත්වීම, ඉෆ්තාර් උත්සව සංවිධානය, මනුෂ්‍යත්වයේ පහන් සිළු දැල්වීම, යතුරුපැදි පෙළපාලි හා සංස්කෘතික උත්සවය මෙම වැඩසටහන් අතර ප්‍රධාන වේ. එම වැඩසටහන් සමාජවාදී තරුණ සංගමයේ මූලිකත්වයෙන් හා ප්‍රගතිශීලී සංවිධාන විශාල ප්‍රමාණයක සහභාගීත්වයෙන් පැවැත්වේ. මෙම මාධ්‍ය සාකච්ඡාව සඳහා එක් වූ සංවිධාන වන්නේ සමාජවාදී තරුණ සංගමය, ජාතික භික්ෂු පෙරමුණ, සමාජවාදී කලා සංගමය, ජාතික මාධ්‍ය සංසදය, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ වෘත්තීයවේදීන්ගේ සංගමය, ශ්‍රී ලංකා මුස්ලිම් කවුන්සිලය, ජාතික විද්වත් සංවිධානය, ලංකා ගුරු සේවා සංගමය, සමාජය හා සාමයික කේන්ද්‍රය (CSR), තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමය, තරුණ මුස්ලිම් සංගමය (YMMA), සමස්ත ලංකා මුස්ලිම් තරුණ පෙරමුණ, එකමුතුව සඳහා ජන රැලිය, අන්තර් සමාගම් සේවක සංගමය, ශ්‍රී ලංකා මුස්ලිම් මධ්‍යස්ථානයයි.

## වෙනිසියුලාවට පනවා ඇති සම්බාධක වහා ඉවත් කරනු!




වෙනිසියුලාවට එරෙහිව පනවා ඇති සම්බාධක වහා ඉවත් කරන ලෙස බලකෙරන සම්මන්ත්‍රණයක් පසුගිය ජූනි 01 දින මරදාන සමාජය හා සාමයික කේන්ද්‍රයේදී පැවැත්විය. එය සමාජවාදී තරුණ සංගමය විසින් සංවිධානය කළ අතර එහිදී ශ්‍රී ලංකාවේ කියුබානු තානාපතිනිය, සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා, වෙනිසියුලාවේ කොමියුනිස්ට් පක්ෂයේ තරුණ සංගමයේ ප්‍රධාන ලේකම්වරයා, ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනයේ උප සභාපති වෛද්‍ය ලසන්ත අබේවර්ණ සහෝදරයා හා ප්‍රවීණ මාධ්‍යවේදී මහින්ද හත්වක මහතා යන අය අදහස් දැක්වූහ.

බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාර, 464/20, ස්ථානයේ පදිංචි බී. පුෂ්ප කුමාර වන මා විසින් අංක 52/3, අතුරුගිරිය පාර, හෝමාගම පිහිටි ක්‍රියේටිව් ස්ටැම්ප් ඇන්ඩ් ප්‍රින්ටින් ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.